# සටහන

2023 ඔක්තෝබර් - දෙසැම්බර්
42 වෙළුම 10 - 12 කලාපය

2 නෝර්වේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්
3 මූල්‍ය සාක්ෂරතාව සහ එහි වැදගත්කම
10 අයවැය / රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය
20 මත්ද්‍රව්‍ය ජාවාරම හා මුදල් විශුද්ධිකරණය: මෑත කාලීන ප්‍රවණතා
25 නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සහ නව ශ්‍රී ලංකා මහ බැංකු පනත: සරල විග්‍රහයක්



ISSN-1391-3697
9 770202 310122
ISSN 1391-3697

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව




# නෝර්වේ

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...



උතුරු යුරෝපයට අයත් රටකි. ඊට බටහිර ස්කැන්ඩිනේවියානු අර්ධද්වීපය, ජැන් මයේන් සහ ආක්ටික් කොදෙව් දූපත් අයත් වේ. වර්ග කිලෝමීටර 385, 207 (වර්ග සැතපුම් 148,729) විශාලත්වයකින් යුක්තයි. ජනගහනය මිලියන 5.5 කි. මෙරටට උතුරු දිශාවෙන් දකුණු ග්‍රීන්ලන්තයත්, නැගෙනහිරින් රුසියාවත්, දකුණින් ඩෙන්මාර්කයේ පටු මුහුදු තීරයත් මායිම් වී ඇත. එහි අගනුවර ඔස්ලෝය. 02 වන ලෝක යුද්ධයෙන් පසු මෙම රට ආර්ථික අතින් වර්ධනය වූ අතර, පළමු දශක දෙක තුළ දී අපනයනය සහ වෙළෙඳ හා ගෘහස්ථ කර්මාන්තකරණයට යොමු වීම මෙරට ආර්ථික වර්ධනයට හේතු විය. 1970 දී තෙල් සහ ස්වභාවික වායු නිධි උතුරු මුහුදෙන් සහ නෝර්වේජියානු මුහුදෙන් සොයාගත් පසු මූල්‍ය වටිනාකමින් පොහොසත් ම රාජ්‍යයක් බවට නෝර්වේ රාජ්‍යය පත්විය. එය ලොව තෙල් අපනයනය කරන රටවල් අතරින් 07 වැනි තැන ගන්නා අතර, පෙට්‍රෝලියම් කර්මාන්තය ජී.ඩී.පී. අගයෙන් කාලයක් සිට උපයයි. 2007, 2010 ලෝක ආර්ථික අවපාතයෙන් නෝර්වීජියන් ක්‍රෝන්වේ හට බලපෑමක් ඇති නොවුණි. එය ලෝකයේ ස්ථාවර ම මුදල් ඒකකයක් වේ. නෝර්වේ රාජ්‍යය තෙල් සම්පතට උරුම පැමත්, එහි ස්වාභාවික වායු, ජල විදුලි බලය, වනාන්තර සහ ඛනිජ සම්පත් තිබීමත් නිසා එය ආර්ථික ස්ථාවරත්වයට බලපා තිබේ. මෙය ලෝකයේ මුහුදු ආහාර සපයන රටවල් අතර ද දෙවැනි තැන ගනී. අනෙකුත් කර්මාන්ත වන්නේ නැව්ගත කිරීම, ආහාර නිෂ්පාදනය, නැව් කර්මාන්ත, වානේ කර්මාන්තය, රසායනික ද්‍රව්‍ය නිපදවීම, පතල්, ධීවර කර්මාන්ත සහ කඩදාසි නිෂ්පාදනයයි. එහි සුබසාධන ආර්ථිකයක් පවතින අතර සෞඛ්‍යය, උසස් අධ්‍යාපනය සහ සමාජ ආරක්ෂණ පද්ධතියක් ද ක්‍රියාත්මක වෙයි. 2021 වසරේ මානව සංවර්ධනය අතින් ඉහළම රට ලෙස නෝර්වේ හඳුනාගෙන ඇත.

මූලාශ්‍ර - World Factbook, Encyclopedia Brittanica

| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය වර්ග කි.මී.<br>ගොඩ බිම් ප්‍රමාණය වර්ග කි.මී.<br>අභ්‍යන්තර ජලාශ වර්ග කි.මී. | <br>323,802<br>304,282<br>19,520 |
| ජනගහනය (2023 ඇස්තමේන්තු) | 5,597,924 |
| ජනගහන වර්ධන වේගය (2023 ඇස්තමේන්තු) | 0.6% |
| උපත් අනුපාතය (2023 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 10.4 |
| මරණ අනුපාතය (2023 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට) | 8.2 |
| ළදරු මරණ අනුපාතය (2023 ඇස්තමේන්තු) (සජීවී උපත් දහසකට) | 1.8 |
| උපතේ දී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2023 ඇස්තමේන්තු) | 83 |
| දළ දේශීය නිෂ්පාදිතය (2021 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 482.2 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (2022 ඇස්තමේන්තු) | 3.3% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2021 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 89,154.28 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2017 ඇස්තමේන්තු)<br>කෘෂිකර්මය<br>කර්මාන්ත<br>සේවා | <br>2.3%<br>33.7%<br>64% |
| ශ්‍රම බලකාය (2021 ඇස්තමේන්තු) | මිලියන 2.971 |
| සේවා වියුක්තිය (2021 ඇස්තමේන්තු) | 4.99% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2019 ඇස්තමේන්තු) | 27.7 |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) (2017 ඇස්තමේන්තු) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 4.4% |
| උද්ධමන අනුපාතය (2021 ඇස්තමේන්තු) | 3.48% |
| ආනයන (2021 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 140.444 |
| ආනයන භාණ්ඩ | කාර්, පිරිපහදු කළ පෙට්රෝලියම්, විකාශන උපකරණ, පරිඝණක, නැව්, නිකල් |
| අපනයන (2021 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 199.074 |
| අපනයන භාණ්ඩ | ස්වභාවික ගෑස්, කාර්, සැමන්, බොර තෙල්, ඇලුමිනියම්, |
| මුදල් ඒකකය | නෝර්වීජියානු ක්‍රෝනර් |

“සටහන” සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

# මූල්‍ය සාක්ෂරතාව සහ එහි වැදගත්කම




එන්.ඒ.අරුණ විජේසිරි
ප්‍රාදේශීය කළමනාකරු
ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාදේශීය කාර්යාලය - අනුරාධපුර


"මුල්‍ය සාක්ෂරතාව ව්‍යවසායකයෙකුට මෙන් ම මිනිස් සමාජයට ද බෙහෙවින් වැදගත් වේ."

## 1. හැඳින්වීම

මිනිස්සු තම ජීවිතය පවත්වා ගැනීම උදෙසා නොයෙකුත් ජීවනෝපායන්හි නිරත වෙති. කෘෂිකාර්මික කටයුතු, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ධීවර කටයුතු, රාජ්‍ය හා පෞද්ගලික සේවය ඇතුළු නොයෙකුත් වෘත්තීන් ඒ අතර වේ.මෙලෙස නොයෙකුත් ජීවන වෘත්තීන්හි නිරත වීමෙන් මුදල් ඉපැයුව ද, ඉපයූ මුදල් නිසි ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් කෙනෙකුට නිසි අවබෝධයක් තිබේ ද යන්න ගැටලු සහගත ය. එනම්, වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් ඔවුනට පවතින දැනුම ප්‍රමාණවත් ද යන ගැටලුව ඔවුන්ගේ ක්‍රියාවන් සමග මතුවන්නකි. එදිනෙදා ජීවිතයේ දී කළයුතු නොකළ යුතු වියදම් පිළිබඳ ව සමාජයේ බොහෝ අයට ප්‍රමාණවත් දැනුමක් තිබෙනවාද යන්න ඔවුන්ගේ හැසිරීම් රටාවන් තුළින් දැකගන්නට නොහැකි ය. තමන්ට එදිනෙදා ජීවිතයේ දී කිරීමට සිදුවන දෛනික වියදම්, අපේක්ෂිත වියදම්, අනපේක්ෂිත වියදම්, කල් දැමිය හැකි වියදම්, අනවශ්‍ය වියදම් පිළිබඳ ව නිසි අවබෝධයකින් තොර ව කටයුතු කරනු ලබන බව එම හැසිරීම් තුළින් පැහැදිලි වේ. මෙම හැසිරීම් රටා වෙනස් නොවුනහොත් ඔවුන් නොදැනුවත් ව ම මුල්‍ය දුෂ්කරතාවකට පත්වන අතර ම තම අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකිවීම නිසා ඉතා අසරණ තත්වයකට ද පත් වේ. තමන්ගේ ආදායමට සරිලන පරිදි වියදම් නොකිරීම හැමවිට ම අනාගතයේ දී බොහෝ මුල්‍යමය අපහසුතා ඇති කරනු ලැබේ.

මුදල් හැසිරවීම පිළිබඳ ව නිසි දැනුමක් නොමැතිවීම හේතුවෙන් මිනිසුන් විවිධ වංචනික ක්‍රියාවන්ට හසු වේ. තමන්ගේ අනාගත මුල්‍ය සුරක්ෂිතතාව අවධානමට ලක් කරමින් හැම විට ම අවිධිමත් මුල්‍ය අංශය සමග ගනුදෙනු කරන බවක් පෙනෙන්නට තිබේ. බොහෝ දෙනෙක් අවදානම ගැන නොසිතා ඉහළ පොලී අනුපාත ගැන පමණක් සිතමින් අවිධිමත් ක්‍රම හරහා ඉතුරුම් පවත්වාගෙන යති. පිරමීඩ වැනි අවිධිමත් යෝජනා ක්‍රමවල තම මුදල් ආයෝජනය කරන බවක් පෙනෙන්නට තිබේ. විවිධ සංවිධානාත්මක කණ්ඩායම් හෝ ආයතන පැමිණ ඔවුනට පිළිසරණ වන මුවාවෙන් ඉක්මනින් හා පහසුවෙන් පොහොසත් විය හැකි නොයෙකුත් ව්‍යාජ මුල්‍ය යෝජනා ක්‍රම සඳහා පුද්ගලයින් යොමු කරගනු ලැබේ. තම ප්‍රාග්ධන අවශ්‍යතාවන් සපුරා ගැනීමට අවිධිමත් අංශයේ මුල්‍ය ආයතන වෙත නැඹුරු වීමක් දකින්නට පුළුවන. අඩු පොලී අනුපාත අයකරන බව, ණය අයදුම්පත් පිරවීම අනවශ්‍ය බව, අනවශ්‍ය ලෙස කාලය වැය නොවන බව, ඇප ලබාදීම අනවශ්‍ය බව අඟවමින් ක්ෂුද්‍ර මුල්‍ය ණය යෝජනා ක්‍රම ආදිය සඳහා ද පුද්ගලයින් යොමු කරගනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කෙරෙන විධිමත් මුල්‍ය ආයතනයකින් තම ණය අවශ්‍යතාව ඉටුකර ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ගැනීමට මිනිසුන් උනන්දුවන්නේ නම් මේ තත්ත්වය බොහෝ දුරට මගහරවා ගත හැකි වේ. නමුත් එවැනි දේකට උත්සුක වන බවක් පෙනෙන්නට නොමැත. මෙවැනි චර්යාවන් සහිත මිනිසුන් වඩාත් විධිමත්, මුල්‍ය විනයක් සහිත පිරිසක් බවට පත්කිරීමේ අවශ්‍යතාව පවතී. ඒ සඳහා ඔවුන් මුල්‍ය සාක්ෂරතාව තුළින් වඩාත් බලගැන්විය යුතු ය.

පවතින මූල්‍ය අපහසුතා හේතුවෙන් මිනිසුන් මෙවැනි ව්‍යාජ ක්‍රමවලට හසුවනවා යැයි කෙනෙකුට කිව හැකි වුවත්, ඔවුන් පිළිබඳ ව අධ්‍යයනයක් කළහොත් ඒ අය පත්වූ අපහසුතාවන්ට හා මූල්‍යමය දුෂ්කරතාවන්ට ප්‍රධාන හේතුව වී ඇත්තේ තම ආදායම ඉක්මවා ගිය වියදම් රටාවක් පැවතීම බව පෙනී ගොස් ඇත. එනම්, ඔවුන්තුළ උපයන මුදල ප්‍රවේශමෙන් හා නිවැරදි ව හැසිරවීම සම්බන්ධ දැනුම හෙවත් මූල්‍ය සාක්ෂරතාවයේ අඩු බවක් පැවතීමයි. ඒ අනුව කෙනෙකුට තමන් ඉතා දුක් මහන්සියෙන් උපයන මුදල නිවැරදි ව හැසිරවීමට හැකි නම් මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ ව නිවැරදි අවබෝධයක් ඇතැයි පැවසීමට පුළුවන.

### 1.1 මූල්‍ය සාක්ෂරතාව යනු කුමක්ද ?

මූල්‍ය සාක්ෂරතාව යන්නෙහි සරල අදහස වනුයේ තමන් ඉතාම දුක් මහන්සි වී උපයන මුදල් නිසි පරිදි පරිහරණය කිරීම සම්බන්ධයෙන් පුද්ගලයෙකු සතුව පවතින දැනුම හා කුසලතාවයි. මේ අනුව මූල්‍ය සාක්ෂරතාවය යන්නට,

- මුදල් ඉපයීම් සම්බන්ධ දැනුම
- මුදල් වියදම් කිරීම සම්බන්ධ දැනුම
- මුදල් ඉතිරි කිරීම සම්බන්ධ දැනුම
- ණය ගැනීම සම්බන්ධ දැනුම
- මුදල් ආයෝජනය කිරීම සම්බන්ධ දැනුම යන කරුණු පිළිබඳව මනා අවබෝධයක් තිබීම ඉතා වැදගත් වේ.

## 2. මුදල් ඉපයීම සම්බන්ධ දැනුම

### 2.1 ප්‍රධාන ආදායම් මාර්ගය දියුණු කරගැනීම

මූල්‍ය සාක්ෂරතාව සහිත පුද්ගලයා හැම විට ම තමන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය දියුණු කර ගැනීමට උත්සාහ ගනු ලබයි. ප්‍රධාන ආදායම් මාර්ගය දියුණු කර ගැනීම නැතහොත් ව්‍යවසායකයෙකුගේ පවතින ආදායම වැඩි කරගැනීම එතරම් පහසු කටයුත්තක් නොවන අතර ඒ සඳහා ක්‍රමවත් එමෙන් ම විධිමත් සැලසුම්ගත වැඩපිළිවෙලක් අවශ්‍ය වේ. එවැනි විධිමත්, නීති විරෝධී නොවන ස්ථාවර ආදායම් මාර්ගයක් සකස් කර ගැනීම සඳහා කෙනෙකුට යම් අවබෝධයක් තිබිය යුතු ය. ඒ අනුව ඕනෑ ම කෙනෙකු තම තමන් නිරතවී සිටින ප්‍රධාන ආදායම් මාර්ගවලින් නිවැරදි ආකාරයට මුදල් ඉපයීම සම්බන්ධ ව දැන සිටිය යුතු කරුණු රාශියකි.

#### 2.1.1. තමන් නිරතවන වෘත්තියට ඇති කැමැත්ත

කෙනෙකු තමන්ගේ කැමැත්තට සහ හැකියාවන්ට සුදුසු ආර්ථික කටයුත්තක නිරත වීම ඉතාමත් වැදගත් වේ. කිසියම් වෘත්තියක් තම ප්‍රධාන ජීවන වෘත්තීය ලෙස තෝරාගෙන කටයුතු කිරීම සඳහා එම වෘත්තියට කැමැත්තක් තිබිය යුතු ය. හැකියාවන්ට නොගැළපෙන, නුසුදුසු සහ අකැමැති කිසියම් ජීවන වෘත්තියක නියැලේ නම් එයින් නිසි ඵල ලබා ගැනීමේ හැකියාවක් නොමැති අතර තමන් අපේක්ෂා කරන ආකාරයේ ආදායමක් ලබා ගැනීමේ හැකියාව ද නොපවතී. එනිසා, තමන්ගේ කැමැත්ත ඇති සුදුසු වෘත්තියක් තම ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ලෙස තෝරා ගැනීමෙන් තමන් අපේක්ෂිත ආදායම් ලබා ගත හැකිවනවා සේ ම ආත්ම තෘප්තියකින් අදාළ කර්මාන්තයේ නිරත විය හැකි ය.

#### 2.1.2. දැනුම සහ පුහුණුව ලබා ගැනීම

යම්කිසි ව්‍යවසායකයෙකු නිපදවන භාණ්ඩ හෝ සේවාවන් ගුණාත්මක වශයෙන් ඉහළ නම් නිතැතින් ම ඉහළ පාරිභෝගික විශ්වාසයක් සහ පිළිගැනීමක් ගොඩනැගෙනු ඇත. එවැනි ගුණාත්මක වශයෙන් ඉහළ නිෂ්පාදනයක් සිදු කිරීම සඳහා ව්‍යවසායකයා සතු දැනුම සහ පුහුණුව ඉතාමත් වැදගත් වේ.

#### 2.1.3. තම ජීවන වෘත්තීය සුළුවෙන් ආරම්භකර අත්දැකීම් ඔස්සේ ඉදිරියට සංවර්ධනය කිරීම

ඕනම ව්‍යාපාරයක් සාර්ථක වීමට නම් ඒ තුළින් ලබාගන්නා අත්දැකීම් ඉතා වැදගත් වේ. අත්දැකීම් ලැබීම තුළින් ව්‍යවසායකයා ලබන පන්නරය ව්‍යාපාරයක් තුළට ඇති විය හැකි අනාගත අවදානම් කළමනාකරණය කරගැනීම සහ ව්‍යාපාරයේ සාර්ථකත්වය සඳහා මනා පිටිවහලක් වේ. ව්‍යාපාරයක ආරම්භක අවස්ථාවේ

අදාළ ව්‍යවසායකයා එකී ව්‍යාපාරයේ හිමිකරු මෙන් ම එහි කළමනාකරු වශයෙන් ද කටයුතු කරනු ලැබේ. ආයතනයේ සේවකයින් හැසිරවීම, මුදල් හැසිරවීම, අළෙවි කටයුතු සඳහා ද ඔහුගේ දායකත්වය හිමි වේ. මෙවැනි කටයුතුවලට මැදිහත් වීමෙන් ලබන අත්දැකීම් අදාළ ව්‍යාපාරයේ අනාගත දියුණුව සඳහා ඉතා වැදගත් වේ. මූල්‍ය සක්ෂරතාවක් සහිත ව්‍යවසායකයා තම අත්දැකීම් හැම විට ම ව්‍යාපාරයේ දියුණුව සඳහා යොදා ගනී. අත්දැකීම් තුළින් තම ව්‍යාපාර දියුණු කරගත් සාර්ථක ව්‍යවසායකයින් දහස් ගණනක් අපට හඳුනා ගත හැකි ය.

### 2.1.4. තමන්ගේ වටිනා ම සම්පත පාරිභෝගිකයා යැයි සිතීම හා කාලය නිසි ලෙස කළමනාකරණය කිරීම

සිය කැමැත්තෙන් ප්‍රධාන ජීවන වෘත්තියක් තෝරා ගෙන එයට අවශ්‍ය දැනුම පුහුණුව ලබා ගනිමින්, සුළුවෙන් ආරම්භ කර අත්දැකීම් ඔස්සේ තමන්ගේ ව්‍යාපාරය සාර්ථක ව ඉදිරියට පවත්වාගෙන යෑම ව්‍යාපාර ලෝකයේ දක්නට ලැබෙන කරුණකි. එහි දී ව්‍යවසායකයා තමන්ගේ වටිනා ම සම්පත පාරිභෝගිකයා වශයෙන් සලකා කටයුතු කළ යුතු ය. පාරිභෝගිකයා සමග වඩාත් හොඳ සමාජ සබඳතාවක් පවත්වා ගැනීම ද මෙහි දී ඉතාමත් වැදගත් වේ. වඩාත් සංවිධානාත්මකව නිශ්චිත කාල සීමාවක් තුළ පාරිභෝගිකයා වෙත තමන්ගේ නිෂ්පාදන ලබාදීමෙන්, ඒ සම්බන්ධයෙන් පවතින අවදානම අවම කර ගනිමින් තමන්ගේ වෙළෙඳපොළ කොටස තහවුරු කර ගත හැකි ය.

### 2.1.5. මුල් අවස්ථාවේ ව්‍යාපාරයේ මුදල් කළමණාකරු ද තමන්ම ය

ව්‍යාපාරය ආරම්භ කළ අවස්ථාවේ සිට ම ව්‍යවසායකයා ලබාගන්නා තවත් එක් වැදගත් අත්දැකීමක් වනුයේ මුදල් කළමනාකරුගේ අත්දැකීමයි. ඒ සඳහා තම ව්‍යාපාරයට දෛනික ව ලැබෙන ආදායම් හා ව්‍යාපාරය සඳහා වැයවන මුදල් ඇතුළත් දෛනික වාර්තා පවත්වාගෙන යෑම ඉතා ම වැදගත් වේ. දෛනික ආදායමෙන් වියදම් අඩු කළ විට සහ මාසික ව ගෙවිය යුතු අනිවාර්ය වියදම් අඩුකළ පසු ඇත්තේ ලාභයක්ද අලාභයක්ද යන්න එමගින් විමසා බැලිය හැකි ය. මෙම වාර්තා උපයෝගී කරගෙන ව්‍යාපාරයට අවශ්‍ය වන මූලික ගිණුම් කරන උපයෝගී පොත් පිළියෙළ කරගත හැකි ය. මුදල් පොත මෙහි දී විශේෂිත වේ. එහි දී තමන් මූලික පොත් පත් පිළියෙළ කරගැනීමට නොදන්නේ නම් ඒ සඳහා දැනුම ඇති වෙනත් අයෙකුගේ සහය ලබා ගත යුතු ය. මේ මූලික ගිණුම්කරණ ලියවිලි ණය මුදලක් ඉල්ලුම් කිරිමේදී ණය අයදුම්පත සමග බැංකු කළමනාකරු වෙත ඉදිරිපත් කළ හැකිය. ඒ අනුව මෙම මූලික ගිණුම් වාර්තා ව්‍යවසායකයාගේ ඉදිරි ව්‍යාපාරික කටයුතු සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

### 2.1.6. ආරම්භක අවස්ථාවේ ව්‍යාපාරයේ සේවක කළමණාකරු ද ව්‍යවසායකයා ම වේ.

ව්‍යාපාරය ආරම්භ කරනවිට එහි ආරම්භක සේවකයා ද ව්‍යවසායකයා ම වේ. ඒ අනුව ව්‍යාපාරයක දියුණුව ඇති කිරීම සඳහා සේවකයෙකු විසින් කළ යුතු දෑ මෙන්ම සේවා කළමනාකරණයක් සිදු කිරීමේ දී ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධව අත්දැකීම් ද මොහු ලබයි. තමා ලද සේවක අත්දැකීම් තුළින් සාර්ථක සේවා කළමනාකරණයක් සිදු කළ හැකි ය. සේවකයෙකු මුහුණදෙන දුෂ්කරතා පිළිබඳ ව තමන් ලද අත්දැකීම් අනුව ඔවුනට මානුෂිකව ද සැලකිය හැකි ය.සේවකයින්ට වඩාත් හොඳින් මානුෂවාදීව සැලකීම තුළින් පෙරලා සේවකයින්ගෙන් ද ව්‍යාපාරයට ප්‍රතිලාභ හිමි වේ. ඒ නිසා ව්‍යාපාරයේ සාර්ථකත්වය සඳහා සේවකයින් මෙහෙය වීම වඩාත් වැදගත් වන අතර එය ආයතනයේ අදායම් ඉහළ යෑම සඳහා ද හේතු වේ. මෙය මූල්‍ය සාක්ෂරතාවයක් සහිත සාර්ථක ව්‍යවසායයෙකුගේ ගති ලක්ෂණයකි.

## 2.2. අතිරේක ආදායම් මාර්ග පිළිබඳ සොයා බැලීම


ඕනෑ ම ව්‍යවසායකයෙකු හෝ පුද්ගලයෙකු තම ආදායම් වැඩිකරගැනීමේ දී තමාගේ ප්‍රධාන ආදායම් මාර්ගය පිළිබද ව සේම, අතිරේක ආදායම් මාර්ගයන් පිළිබඳව ද සොයා බැලිය යුතු ය. සත්ව පාලනය කරන ගොවි මහතෙකු ගවයින් පාලනය කරයි නම් කාබනික පොහොර නිෂ්පාදනය කර අළෙවි කිරීම අතිරේක

ආදායමක් වේ. රූපලාවන්‍යාගාරයක් පවත්වා ගෙන යන ව්‍යවසායයෙකුට සාරි මෝස්තර නිර්මාණය කිරීම අතිරේක අදායමක් වේ.කුමන ව්‍යවසායයක නියුක්ත වී සිටිය ද පොදුවේ කාටත් අතිරේක ආදායම් මාර්ග යක් ලෙස ගෙවත්තක් සකස් සකස් කර ගත හැකිය. ඒ තුළින් වස විසෙන් තොර නැවුම් එළවළු, පළතුරු තමන්ගේ පරිභෝජනය සඳහා ලබා ගැනීමේ හැකියාව පවතින අතර තමන්ට ආහාර සඳහා දැරීමට වන වියදම් ද අඩුකරගත හැකි ය.

මෙවැනි ක්‍රියාමාර්ග හරහා තම ප්‍රධාන ආදායම් මාර්ගය මෙන් ම අතිරේක ආදායම් මාර්ග ගැන සොයා බලා කටයුතු කිරීමෙන් මූල්‍ය සාක්ෂරතාවේ ප්‍රධාන අංගයක්වන "මුදල් ඉපැයීම පිළිබඳ දැනුම" වර්ධනය කර ආදායම වැඩි කර ගැනීම සඳහා කටයුතු කළ හැකි ය.

## 3. මුදල් වියදම් කිරීම සම්බන්ධ දැනුම

මූල්‍ය සාක්ෂරතාවේ තවත් එක් ප්‍රධාන අංගයක් වනුයේ උපයාගත් මුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් ද ප්‍රමාණවත් දැනුමක් පැවතිය යුතු වීමයි.




### 3.1. දෛනික වියදම් (අත්‍යවශ්‍ය වියදම්)

දිනපතා නිවසේ සිදුවන අත්‍යවශ්‍ය වියදම් මේ යටතට ගැනේ. එනම්, ආහාරපාන, අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහන කටයුතු, ජල පරිභෝජනය, විදුලි පරිභෝජනය, දුරකථන ආදි අත්‍යවශ්‍ය වියදම් මේ ගණයට අයත්වේ. තමන්ගේ අදායමින් කිසිසේත් ම අත්හැරිය නොහැකි වියදම් මේ ගණයට වැටේ. මේවා ලේඛණගත කරගැනීමෙන් මසකට හෝ සතියකට යන වියදම පිලිබඳ පුරෝකථනයක් කරගත හැකිය.

### 3.2. අනවශ්‍ය වියදම්

තමන්ගේ ආදායම පිලිබඳව නිසි අවබෝධයකින් තොර ව අසීමාන්තික ව වියදම් කිරීමේ පුරුද්දක් සමාජයේ බොහෝ අයට පවතී. තම අතැති මුදල් ප්‍රමාණය අවසන්වන තෙක් බොහෝ පුද්ගලයින් වියදම් කිරීමට හුරුව ඇත. ඔවුන් අනාගතය ගැන නොසිතා සුඛෝපභෝගී පාරිභෝගික රටාවකට ගොදුරු වී ඇත. ඒ හේතුවෙන් සමාජයේ බොහෝ පිරිසක් තමන්ගේ වියදම් වෙනුවෙන් ණය ලබා ගැනීමට පෙළඹී ඇත. ජනතාව සමහර ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල "ණය උගුලට" හසුවනුයේ ද තමන්ගේ ආදායම් ඉක්මවා ගිය වියදම් රටාවක් පවත්වාගෙන යෑම නිසා ය. ඒ අනුව ඔවුන්ගේ මෙම අනවශ්‍ය වැරදි වියදම් රටාව නිසා මුළු නිවසට ම පීඩනයක් ඇතිවිය හැකි ය. මෙසේ පීඩනයකට මුහුණ දී සිටින අවස්ථාවක වංචාකාරී මූල්‍ය ආයතනයක ගොදුරක් බවට පත්විය හැකි ය. ඔවුන්ගේ විවිධ ණය උගුල්වලට හසුවිය හැක. ඒ අනුව ඔවුන් අවිධිමත් මූල්‍ය ක්ෂේත්‍රයට යොමු වුයේ තමාගේ ම අනවශ්‍ය වියදම් රටාවක් පවත්වාගෙන යෑම නිසා බව පැහැදිලි වේ.

### 3.3. අපේක්ෂිත වියදම්

අනාගත අපේක්ෂාවන් වෙනුවෙන් පුද්ගලයෙකු දැරිය යුතු වියදම් ප්‍රමාණයක් ද ඇත. පුද්ගලයෙකුට අනාගතය සඳහා සිහින තිබිය හැකි ය. මෙම සුබ සිහින ලඟා කර ගැනීම සඳහා වෙහෙසිය යුතු ය. තමාගේ ව්‍යාපාරය දියුණුකර ගැනීම සඳහා, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම, නිවාසයක් ඉදිකර ගැනීම, වාහනයක් මිලදී ගැනීම, හොඳ ජීවන තත්වයක් ඇතිකර ගැනීම, හොඳ සෞඛ්‍ය සේවාවක් ලබා ගැනීම ආදී නොයෙකුත් අපේක්ෂාවන් මිනිසුන් තුළ පවතී. මෙම සුභ සිහින මිනිසුන්ගේ බලාපොරොත්තු වේ. මේවා අත්පත් කරගැනීමට කිසියම් වියදමක් දැරිය යුතු ය.

### 3.4. අනපේක්ෂිත වියදම්

ඕනෑ ම කෙනෙකුට ඕනම මොහොතක අනපේක්ෂිත සිදුවීම්වලට මුහුණ දීමට සිදුවේ. කෙනෙකු අසනීප වීම, හදිසි අනතුරුවලට මුහුණ දීම, සුළි සුලං, ගංවතුර, නාය යෑම් ආදී ස්වභාවික විපත්වලට මුහුණ දීම, සොර සතුරු, ගිනි අනතුරු ආදියට මුහුණ දීමට සිදුවීම, මංගල අවමංගල අවස්ථාවන්ට මුහුණ දීමට සිදුවීම වැනි දේ නිසා අනපේක්ෂිත වියදම්වීම් සිදුවිය හැකි ය. මෙම වියදම් සඳහා පෙර සුදානමක් තිබිය යුතු ය. තම ආදායමින් යම්කිසි මුදල් ප්‍රමාණයක් මෙවැනි හදිසි අවස්ථාවකට ප්‍රයෝජනයට ගැනීම සඳහා වෙන්කර පවත්වාගෙන යෑම මූල්‍ය සාක්ෂරතාවයක් සහිත පුද්ගලයෙකු සතු ලක්ෂණයකි.

### 3.5. කල්දැමිය හැකි වියදම්/අනවශ්‍ය වියදම්

සමහර වියදම් වර්තමානයේ දී සිදු නොකර යම්කිසි කාලසීමාවක් දක්වා කල් දැමිය හැකි ය. ඒ තුළින් වර්තමානයේ පුද්ගලයෙකුගේ ජීවන රටාවට එතරම් බලපෑමක් සිදු නොවේ. කල් දැමිය හැකි වියදම් වර්තමානයේ ඉටුකරගැනීමට යෑමේ දී මූල්‍ය සුරක්ෂිතතාව අඩුවෙන අතර අනාගත ජීවන තත්ත්වය පහත වැටීමක් සිදු විය හැකි ය. තරගකාරී ලෙස නිවසට හෝ ව්‍යාපාරයට මේ මොහොතේ අවශ්‍ය නොවන විවිධ භාණ්ඩ, උපකරණ සඳහා වියදම් නොකර අවශ්‍ය මිළදී ගැනීම් පමණක් සිදු කිරීම නිවැරදි මූල්‍ය සාක්ෂරතාවක් සහිත පුද්ගයෙකුගේ ගති ලක්ෂණයකි.

ඒ නිසා මූල්‍ය සාක්ෂරතාවේ දී ආදායම් උපයනවා මෙන් ම එය නිවැරදි ලෙස වියදම් කරන ආකාරය පිළිබඳව ද දැනුමක් තිබිය යුතු වේ. විශේෂයෙන්ම තමන්ට කිරීමට සිදුවන වියදම් වර්ග පිළිබඳ ව අවබෝධයක් තිබිය යුතු ය.

## 4. ණය මුදලක් ලබාගැනීමේ දී දැන සිටිය යුතු කරුණු රාශියක් ඇති බවත් ඔබ දන්නවා ද ?

ණය මුදලක් ලබා ගැනීමේ දී ඒ පිළිබඳ ව මනා අවබෝධයකින් කටයුතු කිරීම මූල්‍ය සාක්ෂරතාව සහිත පුද්ගලයෙකුගේ විශේෂ ලක්ෂණයකි.

- අපිට ණය අවශ්‍යද ?

කිසියම් කටයුත්තකට ණය මුදලක් ලබාගැනීමේ දී සිතිය යුතු ප්‍රධානතම කරුණක් වනුයේ එම කටයුත්ත ඉටුකර ගැනීම සඳහා ණයක් ලබාගත යුතු ම ද ? යන කාරණයයි. විශේෂයෙන් තමන් ක්‍රමානුකූල ව ඉතිරි කරගත් මුදලක් තැන්පතු ධනයක් ලෙස වර්ධනය වී ඇත්නම්, එයින් කොටසක් යොදා ලබා ගැනීමට බලාපොරොත්තු වන මුළු ණය මුදලෙන් ඉතිරි හිඟ මුදල් ප්‍රමාණය පමණක් ණයක් ලෙස ලබාගැනීම වඩා වැදගත් වේ.

- ඔය ණය ගන්න ආයතන,ඔබට හොඳට ම විශ්වාස ද?

ණය මුදලක් ලබාගැනීමේ දීසැලකිලිමත් විය යුතු තවත් කරුණක් නම් ණය මුදල ලබාගන්නා ආයතනය සම්බන්ධයෙන් පවතින විශ්වාසවන්ත භාවයයි. බොහෝ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන තමන්ගේ ව්‍යාපාරික අදහසින් පමණක් කටයුතු කරන අතර ණය ලබා ගන්න ව්‍යාපාර හෝ පුද්ගලයින් පිළිබඳව සැලකීමක් නොදක්වයි. එහෙත් විධිමත් මූල්‍ය පද්ධතියෙහි ඇති බැංකු හා මූල්‍ය ආයතනවල ප්‍රධාන අරමුණක් වනුයේ ණය ලබාදෙන සිය පාරිභෝගිකයින් ආරක්ෂා කරගනිමින් ඔවුන් රටේ සංවර්ධනයට දායක කර ගැනීමයි. ඒ අනුව විධිමත් මූල්‍ය ආයතනවල ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක හරහා ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, අවශ්‍ය පුහුණුවීම්වලට යොමුකිරීම්, පසුවිපරම් කටයුතු සිදුකිරීම ආදී නොයෙකුත් සේවාවන් තම පාරිභෝගිකයිනට සපයා ඔවුන්ට දියුණු වීමට අවශ්‍ය ශක්තිය ලබාදෙයි. එමෙන් ම විධිමත් මූල්‍ය ආයතන හරහා සහන ණය ලබා දීම මෙන්ම කිසියම් හේතුවක් මත පාරිභෝගිකයින්ට සිය ණය ආපසු ගෙවීම සඳහා දුෂ්කරතාවක් මතු වුවහොත්, ඔවුනට සිය ණය උපදේශන සේවා හරහා සහනදායි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම ද සිදුකරනු ලබයි. ඒ අනුව ලබාගත් ණය මුදල සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ට කිසියම් තොරතුරක් ලබාගැනීමට අවශ්‍ය වුවහොත් විධිමත් ආයතනයක් තුළ විධිමත් ආකාරයේ ක්‍රියාවලියක් පවතී.

- සල්ලි හදිසි නිසා ණය ගිවිසුම අත්සන් කිරීමට කලබල වෙන්න එපා. ණය පොළිය, ආපසු ගෙවීමේ කාලය, ගෙවීමට ඇති වාරිකය තමන්ට ඔරොත්තු දෙනවා ද යන කරුණු ගැන ද සැලකිලිමත් වන්න.

මූල්‍ය සාක්ෂරතාවකින් යුතු පුද්ගලයෙකු ණය මුදලක් ලබා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු තවත් කරුණක් නම් තමන් විසින් අත්සන් කරනු ලබන ණය ගිවිසුම ය. මූල්‍ය ආයතනය මගින් ගිවිසුම තුළ සලකුණු කරනු ලබන ස්ථානවල අත්සන් යොදා ඉක්මනින් ණය මුදල ලබා ගැනීමට උත්සුක නොවී, ණය මුදල සඳහා ලබා දී ඇති කොන්දේසි පිළිබඳ ව, අයකරනු ලබන පොළිය සම්බන්ධව, පොලිය ගණනය කරනු ලබන ආකාරය පිළිබඳ ව, ණය මුදල් ආපසු අයකර ගැනීමේ දී තමන්ට ලබා දී ඇත්තේ තම ආදායමට ඔරොත්තු දෙන වාරිකයක් ද? ආදී කරුණු පිළිබඳව හොඳ විමසිල්ලකින් කටයුතු කළ යුතු ය.

- පොළිය ගණනය කරන ආකාරය ගැන සොයා බැලුවා ද? ලබාදිය යුතු ඇප ආදිය ගැන සොයා බැලුවා ද?

විධිමත් ආයතනයකින් ණය ලබා ගැනීමේ දී වුව ද පොළිය ගණනය කරනු ලබන ආකාරය පිළිබඳ විමසීමක් කළ යුතු ය. එනම්, පොළිය ගණනය කරනු ලබන්නේ හීනවන ශේෂ ක්‍රමයට ද? නැතහොත් සමතල ක්‍රමයට දැයි දැනගෙන ණය ගිවිසුම් ප්‍රකාර ව ඇති දඩ පොලී හා අනෙකුත් අයකරන ගාස්තු පිළිබඳව විමසීමක් කළ යුතු ය. එමෙන් ම යම්කිසි හෙයකින් ණය මුදල ආපසු ගෙවීමට නොහැකි වුවහොත් ඒ සඳහා තබා ඇති ඇප සුරකුම්වලට සිදුවන්නේ කුමක් ද? යන්න ගැන ද ණය මුදල් ලබා ගැනීමට පෙර විමසා සිටිය යුතු ය.

ඒ අනුව ණය මුදලක් ලබා ගැනීමේ දී බොහෝවිට අප සිතිය යුතු වන්නේ එම ණය මුදල ලබාගෙන දියුණු වනවා ද? විනාශ වනවා ද? යන්නයි. ඉහත සාකච්ඡා කරන ලද කරුණු අනුව පැහැදිලි වන දෙයක් නම් විධිමත් ක්ෂේත්‍රයෙන් ණය මුදලක් ලබාගතහොත් අපට දියුණු විය හැකිබවත්, අවිධිමත් ක්ෂේත්‍රයෙන් ණය මුදලක් ලබාගතහොත් අනාගතයේ දී "ණය උගුලකට" හසුවීමට බොහෝ ඉඩකඩ ඇති බව බවත් ය.

## 5. ඉතිරිකිරීම සහ ආයෝජනය කිරීම සම්බන්ධ දැනුම

මූල්‍ය සාක්ෂරතාවේ ඇති ඉතා වැදගත් අංශයන් ලෙස ඉතුරුම් හා ආයෝජන හඳුනා ගත හැකි ය. ඉතුරුම් යනු වර්තමාන පරිභෝජනය කැප කර අනාගතය සඳහා පවත්වා ගෙන යනු ලබන මුදල් තොගය වශයෙන් හඳුන්වා දිය හැකි ය. ඉතිරි කිරීම එතරම් පහසු කටයුත්තක් නොවුව ද පුද්ගලයෙකු විසින් අනිවාර්යෙන් ම කළ යුතු කාර්යයකි. නිවැරදි ව මුදල් උපයා, වියදම් පාලනය කරගත්ත ද ඉතුරුම් පවත්වා ගෙන යනු ලබන්නේ අවිධිමත් මූල්‍ය වෙළෙඳපොළ තුළ ඇති අවිධිමත් මූල්‍ය ආයතනවල නම් ඉන් ගම්‍ය වන්නේ මූල්‍ය සාක්ෂරතාවේ පවතින අඩු බවයි. ඒ නිසා හැම විට ම ඉතුරුම් පවත්වා ගත යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන විධිමත්, ලියාපදිංචි මූල්‍ය ආයතනවල පමණක් වන අතර එසේ සිදු කරනු ලබන ඉතුරුම්වලින් කොටසක් පමණක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන තැන්පතු රක්ෂණ ක්‍රමය තුළින් ආවරණය කෙරෙයි.ඉතිරි කිරීම සඳහා පුද්ගලයෙකුට කැමැත්තක් සහ කැපවීමක් තිබීම අත්‍යවශ්‍ය වේ. අනාගතයේ තමන්ට අවශ්‍ය වන ප්‍රාග්ධන අවශ්‍යතාවන් සපුරා ගැනීමට සහ හදිසි අවස්ථාවක යොදා ගැනීම සඳහා ඉතිරි කිරීම් ඉතා වැදගත් වේ.

### 5.1. මූල්‍ය සාක්ෂරතාව දන්නා පුද්ගලයින් අනාගතය කල් ඇතිව දකියි.

බුදු දහමේ සඳහන් "ව්‍යග්ඝපජ්ජ" සූත්‍රයේ සඳහන් කර ඇති ගාථාවට අනුව පුද්ගලයෙකු තම ගෘහස්ථ ආදායම් කළමනාකරණය කිරිමේදී ඉතිරි කිරීම් කළයුතු ආකාරය ගැන ද සඳහන් කර තිබේ.

> "එකේන භෝගේ භුඤ්ජෙය්‍ය
> ද්විහි කම්මං පයෝජයේ
> චතුත්තංච නිධාපෙයිය
> ආපදාසු භවිස්සති"

එහි සඳහන් ආකාරයට සරල ව ජීවිකාව ගතකර පුද්ගලයෙකු සාධාරණ ව උපයාගන්නා ධනය කොටස් හතරකට බෙදා එක් කොටසක් (1/4) පාරිභෝජන කටයුතු සඳහා ද, කොටස් 2ක් (2/4) ආයෝජන කටයුතු සඳහා ද, ඉතිරි කොටස (1/4) ඉතිරි කිරීම සඳහා ද යොමුකර සිය ආදායම කළමනාකරණය කරගත යුතු

වේ. විශේෂයෙන් ම මෙවැනි ඉතිරිකිරීම්වල වටිනාකම බහුල ව දැනෙන්නේ වර්තමානයේ දී ය. පසුගිය කොවිඩ්-19 වසංගත කාල සීමාවේ දී ව්‍යවසායකයින් මුහුණපෑ ප්‍රධාන ගැටළුවක් වුයේ වැසීමට සිදු වූ ව්‍යාපාර නැවත ටික කලකින් ආරම්භ කිරීමට සහ ඒවා පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රාග්ධනය සොයා ගැනීමයි. එහෙත් තමන්ගේ ආදායමෙන් මාසිකව කිසියම් ප්‍රමාණයක් ඉතිරිකර ගිණුම්ගතකර තිබුනේ නම් එවැනි ව්‍යසන (ආපදා) අවස්ථා වලදී එම ඉතිරිකිරීම්වලින් කොටසක් ඒ සඳහා යොදවා තම ව්‍යාපාර කටයුතු නිරුපද්‍රිතව කරගෙන යාමට හැකියාව තිබුණි.ඒ අනුව මූල්‍ය සාක්ෂරතාවයේ "ඉතිරිකිරීම් සම්බන්ධ දැනුම" ලබාගැනීම ඉතා වැදගත් වේ.

### 5.2. දැනුම් තේරුම් ඇති ආයෝජකයෙකු වීම.

ආයෝජනය යනු කිසියම් ව්‍යාපාරයක් සඳහා අනාගත ආදායම් අපේක්ෂාවෙන් වර්තමානයේ කරනු ලබන මුදල් යෙදවීමක් ලෙස සඳහන් කළ හැකි ය. අප මුලින් සඳහන් කළ ඉතුරුම් විධිමත් මූල්‍ය ආයතනයක පවත්වා ගෙන යෑම ද ආයෝජනයකි. එකී ඉතුරුම් අවධිමත් අංශයේ පවත්වාගෙන යෑම ආයෝජනයක් වුවත් එහි ඇති දැඩි අවදානම්කාරී බව විශේෂයෙන් ම සලකා බැලිය යුතු ය. විධිමත් මූල්‍ය වෙළෙඳපොළ තුල විවිධ ආයෝජන ක්‍රම පවතින අතර ව්‍යවසායකයා හැම විට ම ආයෝජනය කළ යුත්තේ ඉහළ ප්‍රතිලාභයක් ලැබෙන අවදානමට මුහුණ දිය හැකි ආකාරයේ විධිමත් මූල්‍ය පද්ධතිය තුළ ඇති මූල්‍ය උපකරණවල ය. එසේ ආයෝජනය නොකර ප්‍රතිලාභ පමණක් සැලකිල්ලට ගෙන ආයෝජනය කළ පුද්ගලයින්ට පසු ගිය කාලය පුරාවට ම සිදු වූ අපහසුතාවන්, උගත් පාඩම් පිළිබඳ ව ද සැලකිල්ල යොමු කල යුතු වේ.

මේ ආකාරයට මූල්‍ය සාක්ෂරතා දැනුම වර්ධනයකර ගනිමින් එය ප්‍රයෝගික ව ක්‍රියාවට නැංවීම මගින් තමන්ට මුහුණදීමට සිදුවන අනාගත අවදානම් ද කළමනාකරණය කර ගනිමින් තමන් මෙන් ම තම පවුලේ සාමාජිකයන්ගේ ද ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමට කටයුතු කිරීම බෙහෙවින් ම ප්‍රයෝජනවත් වනු ඇත. එහි දී ඔබ ව්‍යවසායකයෙකු ලෙස කිසියම් ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නේ නම් මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ දැනුම ලබාගෙන ඒ තුළින් සාර්ථක ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමට කටයුතු කිරීම ව්‍යවසායක ඔබට මෙන් ම එහි සේවකයින්ට සහ එහි ප්‍රයෝජන බුක්ති විඳින සැමට ඵලදායී වනු ඇත.



# අයවැය / රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය (Budget / Fiscal Transparency)


**කේ. ඒ. යූ. එස්. කේ. තිලකරත්න,**
**නියෝජ්‍ය අධිකාරී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව**



**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ඇතිව රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වැඩි දියුණු කිරීම, වංචා හා දූෂණ මැඩලීම සඳහා ශක්තිමත් නෛතික රාමුවක් හඳුන්වාදීම සහ සවිස්තරාත්මක පාලන විශ්ලේෂණයක් සිදු කිරීම තුළින් දූෂණ සිදු විය හැකි අවදානම් අවම කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාව සමඟ ඇති කරගත් විස්තීරණ ණය පහසුකම් වැඩසටහනෙහි මූලික අංගයකි[1].**


## 1. හැඳින්වීම

අයවැය විනිවිදභාවය යනු මහජන මුදල් රැස් කරගැනීම හා ඒවා වියදම් කරන ආකාරය පිළිබඳ තොරතුරු මහජනයාට සම්පූර්ණයෙන්ම විවෘතවීමයි[2]. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය යනු, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය පිළිබඳව මහජනයාට තොරතුරු ලබා ගත හැකි වීම හා සම්බන්ධ වේ[3]. රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය නැමති සංකල්පයේදී, රාජ්‍ය මූල්‍ය තොරතුරු වාර්තාකරණය හා එම තොරතුරුවල විවෘතභාවය සම්බන්ධව පහත දැක්වෙන පරිදි ප්‍රධාන කරුණු ගණනාවක් සලකා බැලේ.

1) පැහැදිලි බව: රාජ්‍ය මූල්‍ය වාර්තා භාවිත කරන්නන්ට ඒවා පහසුවෙන් වටහා ගත හැකි බවයි.

2) විශ්වාසදායක බව: වාර්තා මගින් රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සහ මූල්‍යකරණය පිළිබඳව කෙතරම් දුරට නිවැරදි තොරතුරු නිරූපණය වේද යන බවයි.

3) වාර ගණන: වාර්තා කෙතරම් කාලයකට වරක් ප්‍රකාශයට පත්වේද යන බවයි.

4) කාලීන බව: වාර්තා ප්‍රකාශයට පත් කෙරෙන්නේ කොපමණ කාල පමාවක් සහිතවද යන බවයි.

5) අදාළත්වය: වාර්තා භාවිතකරන්නන්ට සඵලදායි තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු කෙතරම් ප්‍රමාණයක් වාර්තා මගින් සැපයේද යන බවයි.

6) විවෘතභාවය: මහජනයාට කෙතරම් පහසුවෙන් තොරතුරු සොයා ගත හැකිද, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති තීරණ සඳහා රජය වගවිය යුතු බවට බලපෑම් කළ හැකිද යන බවයි.

## 2. අයවැය විනිවිදභාවයේ ප්‍රයෝජන

1) වගවීම: මහජන මුදල් භාවිතා කරනු ලබන ආකාරය පැහැදිලි වීම වැදගත් වන අතර ඒ අනුව මහජන නියෝජිතයන්ට සහ නිලධාරීන්ට සඵලදායීතාව හා කාර්යක්ෂමතාව පිළිබඳව වගවීමට බැඳිය හැකිය.

2) අවංකත්වය: මහජන මුදල් නාස්තිය හා අවභාවිත කිරීමට අමතරව වංචා කිරීමට ද ඉඩකඩක් ඇත. මහජන මුදල් භාවිත කිරීමේදී දූෂණය වළක්වා

---

1 International Monetary Fund, 2022
2 Organization for Economic Co-operation and Development, 2017
3 International Monetary Fund, 2018

ගැනීම සහ අවංකත්වය පිළිබඳව ඉහළ ප්‍රමිති පවත්වා ගැනීම සඳහා "විනිවිදභාවය යහපත්ම ප්‍රතිපත්තිය" වේ.

3) සර්ව සහභාගිත්වය: අයවැය තීරණ, සමාජයේ විවිධ ජන කණ්ඩායම්වල රුචිකත්වයන් හා ජීවන තත්ත්වය කෙරෙහි දැඩි ලෙස බලපෑම් කළ හැකි අතර, අයවැය ප්‍රතිපත්තිවල බලපෑම පිළිබඳව අවබෝධාත්මකව හා විවිධ පාර්ශ්ව සහභාගී වෙමින් විවාදයක් ඇති කිරීමට විනිවිදභාවය හේතුවේ.

4) විශ්වාසය: මහජනයාගේ අදහස් හා රුචිකත්වයට ගරු කෙරෙන හා මහජන මුදල් නිසි පරිදි භාවිත කෙරෙන විවෘත හා විනිවිදභාවයකින් යුක්ත අයවැය ක්‍රියාවලියක් මගින් විශ්වාසය ඇති කෙරෙයි.

5) ගුණත්වය: විනිවිදභාවයකින් යුක්තව සහ සියලුම පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් අයවැය සකස් කිරීම මගින් යහපත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිඵල සහ ඉහළ ප්‍රතිචාර දක්වනු ලබන, ප්‍රතිඵලදායී හා සාධාරණ මහජන ප්‍රතිපත්ති සඳහා දායක වේ.

## 3. අයවැය / රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය සංකල්පයේ විකාශය

1990 මැද භාගය වන තෙක්ම අයවැය/රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය පිළිබඳව අන්තර්ජාතික වශයෙන් පිළිගත් නිර්වචනයක් නොවීය. නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදයත් සමඟ මෙම සංකල්පයේ වැදගත්කම ඉස්මතු විය. අයවැය/රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය සම්බන්ධව පිහිටවූ ප්‍රධාන ආයතන සහ හඳුන්වා දුන් ප්‍රධාන මාර්ගෝපදේශ, මූලධර්ම සහ දර්ශක පහත දැක්වේ.

1998 - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් Code of Good Practices on Fiscal Transparency හඳුන්වා දෙන ලදී. ඊළඟ වසරේ සිට, මෙම සංග්‍රහය අනුව සිය සාමාජික රටවල රාජ්‍ය මූල්‍ය කටයුතුවල විනිවිදභාවය තක්සේරු ආරම්භ කරන ලදී. සාමාජික රටවල ඉල්ලීම පරිදි මෙම තක්සේරුව සිදු කිරීමට කටයුතු කෙරේ.

2002 - ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය පිළිබඳ සංවිධානය (OECD) විසින් සංවර්ධිත රටවල මධ්‍යම රජයේ අයවැය අංශය පිළිබඳව අවධානය යොමු කරමින් Best Practices in Budget Transparency ප්‍රකාශයට පත් කරන ලදී.

2002 - International Federation of Accountants ආයතනයේ Public Sector Committee විසින් International Public Sector Accounting Standards (IPSAS) ව්‍යාපෘතිය 1996 දී ආරම්භ කරන ලද අතර ඒ යටතේ රාජ්‍ය අංශය සඳහා මූලික ගිණුම්කරණ ප්‍රමිති 2002 වසරේදී හඳුන්වා දෙන ලදී.

2003 - කැණීම් මගින් ලැබෙන අමුද්‍රව්‍ය මත පදනම් වූ කර්මාන්ත මත යැපෙන රටවල රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය සම්බන්ධයෙන් මතු වූ ගැටලු සම්බන්ධයෙන් Extractive Industries Transparency Initiative (EITI) ආයතනය පිහිටුවන ලදී.

2005 - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඛනිජ තෙල් හෝ ඛනිජ ආදායම මත වැඩි වශයෙන් යැපෙන රටවල් සඳහා Guide on Resource Revenue Transparency හඳුන්වා දෙන ලදී.

2005 - යුරෝපා කොමිසම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ප්‍රංශ විදේශ කටයුතු අමාත්‍යංශය, නෝර්වේජියානු විදේශ කටයුතු අමාත්‍යංශය, ස්විට්සර්ලන්තයේ ආර්ථික කටයුතු පිළිබඳ රාජ්‍ය ලේකම් කාර්යාලය සහ එක්සත් රාජධානියේ ජාත්‍යන්තර සංවර්ධන දෙපාර්තමේන්තුව යන අන්තර්ජාතික සංවර්ධන සහකරුවන් කිහිපදෙනෙකුගේ එකතුවෙන් හඳුන්වා දුන් Public Expenditure and Financial Accountability (PEFA) වැඩි වශයෙන් පහළ හා මැදි ආදායම් රටවල් විසින් භාවිත කරනු ලැබේ.

2006 - අන්තර්ජාතික අයවැය සහයෝගීතාව (International Budget Partnership (IBP)) විසින් විවෘත අයවැය සමීක්ෂණය (Open Budget Survey) හඳුන්වා දෙන ලදී.

2011 - අන්තර්ජාතික ආයතන ගණනාවක එකතුවෙන් Global Initiative for Fiscal Transparency (GIFT) ආරම්භ කරන ලදී.

2014 - International Federation of Accountants (IFCA) විසින් රාජ්‍ය අංශයේ යහපාලනයේ

කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා International Framework( Good Governance in Public Sector හඳුන්වා දෙන ලදී.

2015 - ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය පිළිබඳ සංවිධානය (OECD) විසින් නූතන අයවැයකරණයේ විවිධ පැතිකඩවලට අදාළ මූලධර්ම 10ක් ඉදිරිපත් කරමින් Recommendation of the Council on Budgetary Governance හඳුන්වා දෙන ලදී.

2017 - ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය පිළිබඳ සංවිධානය (OECD) විසින් Budget Transparency Toolkit හඳුන්වා දෙන ලදී.

2018 - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් Fiscal Transparency Handbook හඳුන්වා දෙන ලදී. මේ මගින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය පිළිබඳ ඇගයීම නිරූපනය වේ. එසේම, Fiscal Transparency Code වලට අදාළ මූලධර්ම සහ පරිචයන් ක්‍රියාත්මක කිරීම සඳහා විස්තරාත්මක මග පෙන්වීම් ඉදිරිපත් කරනු ලබන අතර රටවල රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය හා වගවීම ඉහළ නැංවීම සඳහා නව පදනමක් සකස් කරනු ලබයි.

2019 - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් Fiscal Transparency Code සංශෝධනය කරන ලදී.

2022 - GIFT විසින් Transparency Principles for Tax Policy and Administration හඳුන්වා දෙන ලදී. මෙය ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ සිවිල් සංවිධාන නියෝජිතයන්ට රාජ්‍ය බදු පද්ධති ඇතුළත් වන නීති, නියාමන හා ආයතනික රාමු ඇගයීමට හා වැඩි දියුණුකිරීමට උපකාරී වේ.

## 4. අයවැය/රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය මැනීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන අන්තර්ජාතික ප්‍රමිති

ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය පිළිබඳ සංවිධානය විසින් 2017 දී ප්‍රකාශයට පත් කරන ලද Budget Transparency Toolkit මගින් අයවැය/රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය මැනීම සඳහා භාවිත කරනු ලබන ප්‍රධාන අන්තර්ජාතික ප්‍රමිති 17ක් ලැයිස්තුගත කර ඇත.

**රූප සටහන 1**

**අයවැය/රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය මැනීම සඳහා භාවිත කරනු ලබන ප්‍රධාන අන්තර්ජාතික ප්‍රමිති**

| | |
|---|---|
| **Official standards / legal instruments** | |
| **IMF Code** | IMF (2014), The Fiscal Transparency Code |
| **OECD Budget Principles** | OECD (2015), Recommendation of the Council on Budgetary Governance |
| **Other core reference materials** | |
| **GIFT High Level Principles** | GIFT (2012), High-Level Principles on Fiscal Transparency, Participation and Accountability |
| **IBP Open Budget Survey** | IBP (2017), Guide to the Open Budget Questionnaire |
| **OECD Best Practices** | OECD (2002), Best Practices Budget Transparency |

| | |
|---|---|
| **PEFA** | PEFA (2016), Framework for Assessing Public Financing Management |
| **Other key international guidance, tools and professional / technical standards** | |
| **CPA Benchmarks** | Commonwealth Parliamentary Association (2015), Recommended Benchmarks for Domestic Legislatures |
| **EITI** | EITI (2016), The EITI Standard 2016 |
| **GIFT Public Participation** | GIFT (2015), Principles of Public Participation in Fiscal Policy |
| **G20 Open Data** | G20 (2015), anti-corruption Open Data Principles |
| **IMF GFSM** | IMF (2014), Government Finance Statistics Manual |
| **IPSAS** | IPSASB (2016), International Public Sector Accounting Standards |
| **ISSAI** | International Organization of Supreme Audit Institutions, The International Standards of Supreme Audit Institutions |
| **Open Data Charter** | International Open Data Charter http://opendatacharter.net/ |
| **OECD Digital Government** | OECD (2014), Recommendation of the Council on Digital Government Strategies |
| **OECD IFI Principles** | OECD (2014), Recommendation of the Council on Principles for Independent Fiscal Institutions |
| **OECD Public Procurement** | OECD (2015), OECD Recommendation of the Council on Public Procurement |

මූලය: OECD Budget Transparency Toolkit, 2017

මෙහිදී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වැදගත් ප්‍රධාන ප්‍රමිති දෙකක් වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය පිළිබඳ සංග්‍රහය සහ විවෘත අයවැය දර්ශකය පිළිබඳව දීර්ඝව සාකච්ඡා කෙරේ.

4.1 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය පිළිබඳ සංග්‍රහය

**IMF's Fiscal Transparency Code**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය පිළිබඳ සංග්‍රහය රාජ්‍ය මූල්‍ය පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමේ අන්තර්ජාතික ප්‍රමිතිය වේ. රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය හා වගවීම් වැඩිදියුණු කිරීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා සහය වීම, රාජ්‍ය

**රූප සටහන 2**
**රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය පිළිබඳ මූලධර්ම**

| 1) රාජ්‍ය මූල්‍ය වාර්තාකරණය | 2) රාජ්‍ය මූල්‍ය පුරෝකථන හා අයවැයකරණය | 3) රාජ්‍ය මූල්‍ය අවදානම් විශ්ලේෂණය හා කළමනාකරණය | 4) ස්වාභාවික සම්පත් ආදායම් කළමනාකරණය |
|---|---|---|---|
| 1.1 ආවරණය | 2.1 පූර්ණත්වය | 3.1 අවදානම් විශ්ලේෂණය හා හෙළිදරව් කිරීම | 4.1 සම්පත් හිමිකාරිත්වය හා අයිතීන් |
| 1.2 වාර ගණන හා කාලීන බව | 2.2 නීතිගත බව | 3.2 අවදානම් කළමනාකරණ | 4.2 සම්පත් ආදායම් එක්රැස් කර ගැනීම |
| 1.3 ගුණත්වය | 2.3 ප්‍රතිපත්ති අභිමුඛ | 3.3 රාජ්‍ය මූල්‍ය සහයෝගීතාව | 4.3 සම්පත් ආදායම් භාවිත කිරීම |
| 1.4 ඒකාබද්ධතාව | 2.4 විශ්වාසනීයත්වය | | 4.4 සම්පත් ක්‍රියාකාරකම් හෙළිදරව් කිරීම |

මූලයන් :OECD Budget Transparency Toolkit 2017
IMF Fiscal Transparency Code, 2019

මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම හා ප්‍රතිපත්ති සංවාද ශක්තිමත් කිරීම සඳහා මෙම සංග්‍රහය මගින් මූලධර්ම ඉදිරිපත් කරනු ලබයි. මෙය 1998 දී මුල්වරට ඉදිරිපත් කරන ලද අතර ඉන් පසුව 2007, 2014 සහ 2019 වසරවල දී සංශෝධනය කර ඇත. මෙම මූලධර්ම කාණ්ඩ හතරක් යටතේ ඉදිරිපත් කර ඇත.


ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සිය සාමාජික රටවල ඉල්ලීම පරිදි මෙම සංග්‍රහය අනුව එම රටවල රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය තක්සේරු කරනු ලබයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් 2002 සහ 2005 වසරවල දී සිදු කරන ලද මෙම තක්සේරු කිරීම් පිළිබඳ වාර්තා (Sri Lanka: Report on the observance of standards and codes - Fiscal Transparency Module) ප්‍රකාශයට පත් කර ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සිය සාමාජික රටවල රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය තක්සේරු කිරීම් මගින් එම රටවලට ඔවුන්ගේ රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය පිළිබඳ පරිචයන් සම්බන්ධව සම්පූර්ණ තක්සේරුවක් ලබා දෙන අතර ඔවුන් මුහුණ දෙනු ලබන රාජ්‍ය මූල්‍ය අවදානම ගණනය කරනු ලබයි. එසේම, රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය පිළිබඳ සංග්‍රහයේ දක්වා ඇති පරිදි විනිවිදභාවය පිළිබඳ යහපත් පරිචයන් ඇතිකර ගැනීම සඳහා අනුපිළිවෙලක් සහිත හා ප්‍රමුඛතාගත කළ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරනු ලැබේ. විනිවිදභාවය පිළිබඳ සෑම මූලධර්මයක් සඳහාම, මෙම සංග්‍රහය මගින් මූලික, යහපත් හා උසස් වශයෙන් පරිචයන් කොටස් තුනකට බෙදා, මෙම සංග්‍රහය සඳහා සම්පූර්ණයෙන් අනුගත වීමට කළ යුතු කාර්යයන් පැහැදිලිව දක්වා ඇති අතර, එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සියලු සාමාජික රටවල යොදා ගනු ලැබීම ද සහතික කරනු ලැබේ.

### 4.2. විවෘත අයවැය දර්ශකය (Open Budget Index)


මෙය අන්තර්ජාතික අයවැය සහයෝගීතාව (International Budget Partnership/ IBP) මගින් මධ්‍යම රජයේ අයවැය විනිවිදභාවය පිළිබඳව සකස් කරනු ලබන ස්වාධීන, සංසන්දනාත්මක මිණුමකි. රටක විවෘත අයවැය දර්ශකයේ ලකුණු මගින් විනිවිදභාවයේ ප්‍රමාණය මනිනු ලබයි. රටක අයවැය සම්බන්ධ

**රූප සටහන 3**
**ශ්‍රී ලංකාවේ අයවැය විනිවිදභාවය: 2006 - 2021**




මූලය: විවෘත අයවැය සමීක්ෂණය 2021

**රූප සටහන 4**
**ශ්‍රී ලංකාවේ අයවැය විනිවිදභාවය තෝරාගත් අනෙකුත් රටවල් සමඟ සංසන්දනාත්මක ලෙස: 2021**




මූලය: විවෘත අයවැය සමීක්ෂණය 2021

ප්‍රධාන ලේඛන අටකට අදාළව රජයේ වෙබ් අඩවිවල නියමිත කාලයට මහජනයාට තොරතුරු ලබාදීම සහ මහජනයාට ප්‍රසිද්ධ කර ඇති අයවැය තොරතුරුවල සම්පූර්ණතාව මෙහිදී සලකා බලනු ලබයි. අයවැය සම්බන්ධිත ප්‍රධාන ලේඛන අටට, පූර්ව අයවැය ප්‍රකාශනය, විධායකයේ අයවැය යෝජනා, සම්මත කළ අයවැය, අන්තර් වාර්ෂික (මාසික/කාර්තුමය) වාර්තා, මධ්‍ය වාර්ෂික සමාලෝචනය, වාර්ෂික වාර්තාව,

විගණන වාර්තාව සහ පුරවැසි අයවැය අයත් වේ. මෙම දර්ශකය, විවෘත අයවැය සමීක්ෂණය (Open Budget Survey) පදනම් කරගෙන සකස් කරනු ලබන අතර, සෑම රටක් සඳහාම ලකුණු 0 - 100 අතර ප්‍රමාණයක් ලබා දෙයි. මෙම දර්ශකය 2006 වසරේ සිට සකස් කරනු ලැබේ.

විවෘත අයවැය දර්ශකය අනුව, ශ්‍රී ලංකාවේ අයවැය විනිවිදභාවය සඳහා 2021 වර්ෂයේදී ලකුණු 100න් 30ක් වාර්තා කර ඇති අතර එය ප්‍රමාණවත් නොවන මට්ටමක පවතී. එසේම, කලාපීය සහ තරගකාරී රටවල් සමඟ සැසඳීමේදී ද ශ්‍රී ලංකාවේ අයවැය විනිවිදභාවය එතරම් ප්‍රශංසනීය මට්ටමක නොපවතින අතර 2021 වසරේ දී රටවල් 120කින් ශ්‍රී ලංකාව 93 වන ස්ථානයේ පසු විය.

### 5. නිර්දේශ

ශ්‍රී ලංකාව අයවැය විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බව විවෘත අයවැය සමීක්ෂණය - 2021 වාර්තාවේ දැක්වේ.

1) පූර්ව අයවැය ප්‍රකාශයක් කාලීනව මාර්ගගතව ප්‍රකාශයට පත් කිරීම

- මුදල් අමාත්‍යාංශය විසින් සකස් කරනු ලබන අයවැය කැඳවීම (Budget Call). මෙය පූර්ව අයවැය ප්‍රකාශය ලෙස සැලකේ. කෙසේ නමුත්, එය ඉදිරිපත් කරනු ලබන්නේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වෙත බැවින් එය අභ්‍යන්තර ලේඛනයක් ලෙස වර්ග කරනු ලබයි. එය මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර තිබුණද මහජනයා සඳහා ප්‍රකාශයට පත් කිරීමක් ලෙස නොසැලකේ.

2) පුරවැසි අයවැය, අන්තර් වාර්ෂික (මාසික/කාර්තුමය) වාර්තා සහ මධ්‍ය වාර්ෂික වාර්තාව සකස් කිරීම සහ කාලීනව, මාර්ගගතව ප්‍රකාශයට පත් කිරීම

- ශ්‍රී ලංකාව වර්තමානයේදී පුරවැසි අයවැයක් සකස් කරනු නොලබයි.
- අන්තර් වාර්ෂික වාර්තා අඛණ්ඩව අවම කාල පමාවකින් ප්‍රකාශයට පත් කළ යුතුය.
- ශ්‍රී ලංකාව වර්තමානයේ මාස 6ක රාජ්‍ය මූල්‍ය දත්ත ඇතුළත් වාර්තාවක් ප්‍රකාශයට පත් කරනු නොලබයි. මුදල් අමාත්‍යාංශයේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ ඇතුළත් වන්නේ මාස 4ක දත්ත පමණි.

**සංඛ්‍යා සටහන 1**
**අයවැය විනිවිදභාවය මැනීමට යොදාගනු ලබන අයවැය සම්බන්ධිත ප්‍රධාන ලේඛන**

| ලේඛනය | සලකා බැලූ රාජ්‍ය මූල්‍ය වර්ෂය | ලකුණු මට්ටම |
|---|---|---|
| පූර්ව අයවැය ප්‍රකාශනය | 2021 | අභ්‍යන්තර භාවිතය සඳහා |
| විධායකයේ අයවැය යෝජනා | 2021 | 31 |
| සම්මත කළ අයවැය | 2021 | 89 |
| පුරවැසි අයවැය | 2021 | සකස් කරනු නොලබයි |
| අන්තර් වාර්ෂික (මාසික/ කාර්තුමය) වාර්තා | 2020 | සකස් කරනු නොලබයි |
| මධ්‍ය වාර්ෂික සමාලෝචනය | 2020 | සකස් කරනු නොලබයි |
| වාර්ෂික වාර්තාව | 2019 | 57 |
| විගණන වාර්තාව | 2019 | 33 |

මූලය : විවෘත අයවැය සමීක්ෂණය 2021

3) විධායකයේ අයවැය යෝජනා සමග කෙටුම්පත් අයවැය ඇස්තමේන්තු අඛණ්ඩව ප්‍රකාශයට පත් කිරීම. තවද, කාර්යයන් අනුව වියදම් වර්ගීකරණය, වර්ෂ කිහිපයක් සඳහා ආදායම් හා වියදම් ඇස්තමේන්තු, අයවැය වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල රාජ්‍ය ණයෙහි සංයුතිය සහ අයවැයෙන් බාහිර අරමුදල් හා බදු වියදම් පිළිබඳ විස්තර ඇතුළත් කිරීම

4) ණය ගැනීමේ ඇස්තමේන්තු සමග සත්‍ය වශයෙන් ලබාගත් ණය ප්‍රමාණය සංසන්දනය කිරීම, සැලසුම් කළ මූල්‍යමය නොවන ප්‍රතිඵල සමග සත්‍ය තත්ත්වය සංසන්දනය කිරීම සහ සාර්ව ආර්ථික පුරෝකථන හා සත්‍ය කාර්ය සාධනය සංසන්දනය කිරීම.

5) විගණන වාර්තාවෙහි සම්පූර්ණත්වය වැඩි දියුණු කිරීම. ප්‍රධාන විගණන සොයා ගැනීම් ඇතුළත් කරමින් විධායක සාරාංශයක් විගණන වාර්තාවට ඇතුළත් කිරීම මගින් මෙම වැඩි දියුණු කිරීම සිදු කළ හැකිය.

## 6. ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවට රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග රාශියක් පවතී. ප්‍රධාන වශයෙන්ම, රාජ්‍ය මූල්‍ය දත්ත පුළුල් පරාසයක් ආවරණය කරමින් නිවැරදිව හා කාලීනව සම්පාදනය කිරීමට කටයුතු කළ යුතුය. වර්තමානයේ රාජ්‍ය මූල්‍ය දත්ත සම්පාදනය කිරීමේදී 1986 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොත භාවිත කරන අතර, ඒ වෙනුවට එහි නවතම සංස්කරණය වන 2014 අත්පොත යටතේ රාජ්‍ය මූල්‍ය දත්ත ඉදිරිපත් කිරීම වඩාත් යෝග්‍ය වේ. මෙම 2014 අත්පොත මූර්ත, මූල්‍ය හා විදේශ යන අනෙකුත් අංශ දත්ත සම්පාදනය කිරීමේදී යොදා ගන්නා නවතම අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වේ. තවද, වර්තමානයේදී අයවැයගත මධ්‍යම රජය (Budgetary Central Government) සඳහා රාජ්‍ය මූල්‍ය දත්ත (රජයේ ආදායම, වියදම, අයවැය හිඟය හා මූල්‍යනය වැනි) ඉදිරිපත් කරන අතර, වඩාත් පුළුල් පරාසයක රාජ්‍ය මූල්‍ය දත්ත ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කළ හැකිය. අන්තර්ජාතික වශයෙන් රාජ්‍ය මූල්‍ය දත්ත සංසන්දනය කිරීම සඳහා සමස්ත රජය (General Government) යන සංකල්පය පොදුවේ භාවිත වේ. ඒ අනුව, අයවැයගත නොවන ආයතන සහ පළාත් පාලන ආයතන හා පළාත් සභාවල දත්තද ඇතුළත් කරමින් සමස්ත රජය සඳහා දත්ත ඉදිරිපත් කිරීම මූලික අවශ්‍යතාවයකි. මීට අමතරව, රාජ්‍ය සංස්ථා ද ඇතුළත් කරමින් රාජ්‍ය අංශය (Public Sector) සඳහාම දත්ත ඉදිරිපත් කිරීම වඩාත්ම යෝග්‍ය ක්‍රමය වේ. මීට අමතරව, වර්තමානයේ රාජ්‍ය මූල්‍ය දත්ත සම්පාදනය සඳහා වැඩිදියුණු කළ මුදල් පදනම (modified cash basis) යොදා ගන්නා අතර ඉන් ඔබ්බට ගොස් උපචිත පදනම (accrual basis) භාවිත කිරීම ප්‍රශස්තම ක්‍රමවේදය වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය ඇතිව මෙම වැඩිදියුණු කිරීම් සිදු කිරීමට මුදල් අමාත්‍යාංශය කටයුතු කරමින් සිටියි. තවද, 2023 පෙබරවාරි මස සිට මුදල් අමාත්‍යාංශය විසින් නොපියවූ රාජ්‍ය ණය පිළිබඳ විස්තර ඇතුළත් කරමින් කාර්තුමය ණය විවරණිකාවක් (Quarterly Debt Bulletin) ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර ඇත. මෙම විවරණිකාව තවදුරටත් වැඩි දියුණු කරමින් රාජ්‍ය ණය සේවාකරණය පිළිබඳ දත්තද ඉදිරිපත් කිරීමට මුදල් අමාත්‍යාංශය කටයුතු කරනු ඇත. තවද, රාජ්‍ය අංශයේ වගකීම් පිළිබඳ පමණක් නොව රාජ්‍ය අංශයේ වත්කම් පිළිබඳව ද පුළුල් ලෙස තොරතුරු ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වේ.

එසේම, රජය විසින් බදු සහන ලබාදීමේදී ඒ මගින් ඇතිවන පිරිවැය පිළිබඳ විශ්ලේෂණයක් ප්‍රකාශයට පත් කිරීම රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය ඉහළ නැංවීමට හේතුවේ. සමාගම්වලට 2022 වර්ෂයේදී නිකුත් කළ බදු සහතික පිළිබඳ වාර්තාවක් සහ සුබෝපභෝගී බදු නිදහස් කිරීම් යටතේ ආනයන කළ වාහන පිළිබඳ වාර්තාවක් මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කර ඇත. මීට අමතරව, බදු වියදම් පිළිබඳව 2017, 2018 සහ 2019 අයවැයවලදී ප්‍රකාශයක් ඉදිරිපත් කළ අතර නැවත එම විශ්ලේෂණය ප්‍රකාශයට පත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ හැකිය.

රජයේ අයවැය ඇතුළු රාජ්‍ය මූල්‍ය වාර්තාවල ඉදිරිපත් කරනු ලබන ආර්ථික හා රාජ්‍ය මූල්‍ය පුරෝකථන නිරන්තරයෙන් අධිතක්සේරු වී ඇති බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, රාජ්‍ය ආදායම අධිතක්සේරු කර

පුරෝකථනය කිරීමෙන් ඊළග වසරේදී එම ආදායම් ඉලක්කය අත්පත් කර ගැනීමට නොහැකි වීම නිසා රාජ්‍ය වියදම් කපා හැරීමටත්, අයවැය හිඟය පුළුල් වීමෙන් ණය ගැනීම් ඉහළ නැංවීමටත් සිදු වේ. මේ හේතුවෙන්, ස්වාධීන ආයතනයක් විසින් රජයේ ආර්ථික හා රාජ්‍ය මූල්‍ය පුරෝකථනවල විශ්වාසනීයත්වය ඇගයීමට භාජනය කිරීම අන්තර්ජාතිකව පිළිගත් යහපත් පරිචයක් වේ. තවද, රජය විසින් මේ දිනවල රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගතකරණය හරහා ණය තිරසරභාවය නැවත අත්කර ගැනීමේ උත්සාහයක නිරත වී සිටියි. මේ අනුව, ප්‍රධාන රාජ්‍ය මූල්‍ය විචල්‍යයන්ගේ දිගු කාලීන තිරසරභාවය පිළිබඳ වාර්තාවක් නිතිපතා ප්‍රකාශයට පත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් වනු ඇත.

වර්තමානයේදී ශ්‍රී ලංකාවේ පාරිසරික අවදානම් පිළිබඳව අවධානය යොමු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් උද්ගත වී ඇත. ශ්‍රී ලංකාව පාරිසරික අවදානම් ඉහළම රටවල් අතරින් එකක් ලෙස සැලකෙන අතර 2018, 2019 සහ 2020 Global Climate Vulnerability Index අනුව, පිළිවෙලින් 4, 2 සහ 6වන ස්ථානවල පසුවිය. මේ හේතුවෙන්, පාරිසරික ආපදා මගින් ඇතිවිය හැකි රාජ්‍ය මූල්‍ය අවදානම් හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම වැදගත් වනු ඇත.

එසේම, ශ්‍රී ලංකාව ඛනිජ තෙල් සම්පත් ගවේෂණය ආරම්භ කර ඇති අතර, 2007 දී ප්‍රථම වරට ඛනිජ තෙල් ගවේෂණය සඳහා බලපත්‍ර ලබා දෙන ලද අතර 2021දී ඛනිජතෙල් සම්පත් පනත සංශෝධනය කරමින් ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය පිහිටුවීමට කටයුතු කරන ලදී. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් Fiscal Transparency Code යටතේ ස්වභාවික සම්පත් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති මූලධර්ම අනුගමනය කිරීමට කටයුතු කිරීම, රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය ඉහළ නැංවීමට හේතු වනු ඇත.

මීට අමතරව, 2023 සැප්තැම්බර් මස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නිකුත් කරන ලද යහපාලනය සම්බන්ධ ගැටළු තක්සේරු කිරීමේ වාර්තාව (Governance Diagnostic Assessment) මගින් අයවැය සකස් කිරීම සහ රාජ්‍ය මූල්‍ය රාමුව වැඩිදියුණු කිරීම සඳහා ලබා දී ඇති නිර්දේශ පහත පරිදි දැක්විය හැකිය.

**සංඛ්‍යා සටහන 2**

**අයවැය සකස් කිරීම සහ රාජ්‍ය මූල්‍ය රාමුව වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ**

| ක්‍රියාමාර්ගය | ආයතනය | කාල සීමාව |
|---|---|---|
| 1. රාජ්‍ය මූල්‍ය වගකීම් රාමුව, අයවැය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ නීතියක් (Public Financial Management Law) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | මුදල් අමාත්‍යංශය | 2024 පෙබරවාරි |
| 2. මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවේ (Medium Term Fiscal Framework) අන්තර්ගත විශ්ලේෂණවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම | මුදල් අමාත්‍යංශය | 2024 ජූනි |
| 3. රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන වර්ගීකරණයට අනුකූලව සමස්ත රජයට (General Government) ඇතුලත් වන සෑම ආයතනයක් සඳහාම සැලසුම් කළ මූලාශ්‍ර සහ සියලු අරමුදල් භාවිතය සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමක් අයවැය ලේඛන තුළ ඇතුළත් කිරීම | මුදල් අමාත්‍යංශය | 2024 ඔක්තෝබර් |

මූලය : IMF Governance Diagnostic Assessment, 2023

## මූලාශ්‍ර

1. Extractive Industries Transparency Initiative (EITI) Website. Available at: https://eiti.org/ (Accessed: 7 September 2022).
2. International Budget Partnership (2020) Open Budget Survey 2019. International Budget Partnership.
3. International Budget Partnership (2022) Open Budget Survey 2021. International Budget Partnership.
4. International Monetary Fund (2002) Sri Lanka: Report on the Observance of Standards and Codes - Fiscal Transparency Module. IMF Country Report No. 02/233. Washington, D.C.: International Monetary Fund.
5. International Monetary Fund (2005) Sri Lanka: Report on the Observance of Standards and Codes - Fiscal Transparency Module-Update. IMF Country Report No. 05/251, 2005. Washington, D.C.: International Monetary Fund.
6. International Monetary Fund (2018) Fiscal Transparency Handbook. Washington, D.C.: International Monetary Fund.

# මත්ද්‍රව්‍ය ජාවාරම හා මුදල් විශුද්ධිකරණය : මෑත කාලීන ප්‍රවණතා



**ඩබ්. ජී. ඊ. නිල්මිණී, සහකාර අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය**
**එම්. යූ. ඩබ්. පතිරණ, සහකාර අධ්‍යක්ෂ, මූල්‍ය බුද්ධි ඒකකය**

"කුඩු අංජුගේ දේපොළ තහනම් කරයි - ඩුබායි රටේ සැඟව සිටින මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු වන රත්මලානේ කුඩු අංජු නැමැත්තාගේ මත්ද්‍රව්‍ය ජාවාරමෙන් මිලදී ගත් බව කියන රුපියල් කෝටි 3කට ආසන්න දේපළ අද (21) තහනම් කරනු ලැබූ බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නීති විරෝධී දේපළ හෝ වත්කම් විමර්ශන කොට්ඨාසය කියයි. තහනමට ලක් කරන ලද දේපළ අතර මොරටුමුල්ල ප්‍රනාන්දු මාවතේ සුඛෝපභෝගී නිවාස සහිත ඉඩම් දෙකක්, ලොරියක්, ත්‍රීරෝද රථයක් සහ යතුරු පැදියක් ද වන බව පොලිසිය කියයි" (උපුටා ගැනීම - 2022 ජනවාරි 21 ලංකාදීප පුවත්පත)

## 1. හැඳින්වීම

මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් පිළිබඳ ඉහත ආකාරයේ පුවත් ඔබට නිරන්තර ව අසන්නට දකින්නට ලැබුන ද, මෙලෙස නීති විරෝධී ආකාරයෙන් උපයා ගන්නා මුදල්වල මූලාශ්‍රය සඟවමින් ගනුදෙනුවල නිරත වූයේ කෙසේද යන්න ඔබ මොහොතකට හෝ කල්පනා කර තිබේද? මුදල් උපයනු ලබන මූලාශ්‍රය නීති විරෝධී නම් එලෙස උපයන ලද මුදල් ද නීති විරෝධී බව අමුතුවෙන් කිව යුතු නොවේ. මත්ද්‍රව්‍ය ජාවාරම රටක දේශපාලන, ආර්ථික, සමාජයීය යන සෑම ක්ෂේත්‍රයකට ම අහිතකර බලපෑම් සහ අභියෝග එල්ල කරන බව අවිවාදාත්මක ය. විශේෂයෙන් ම, දකුණු ආසියානු කලාපය ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය වෙළෙඳාමේ කේන්ද්‍රස්ථානයක් ලෙස දැක්විය හැකි ය. මන්ද යත්, මෙම කලාපය අන්තරාදායක ඖෂධ/මත්ද්‍රව්‍ය නිපදවීමේ මූලාශ්‍රයක්, ජාවාරම්කරුවන්ගේ හුවමාරු මාර්ගවල සංධිස්ථානයක් මෙන් ම භාවිත කරන්නන්ගේ නවාතැන් පොළක් ද වේ. ශ්‍රී ලංකාව තුළ නීති විරෝධී මුදල් ජනිත කරනු ලබන ප්‍රධානතම මූලාශ්‍රය 'මත්ද්‍රව්‍ය ජාවාරම' බවට 2021/2022 ජාතික අවදානම් තක්සේරුවේ දී[1] ද හඳුනාගෙන ඇත.

## 2. මත්ද්‍රව්‍ය ජාවාරම හා මුදල් විශුද්ධිකරණය

මත්ද්‍රව්‍ය ජාවාරම යන්නට නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ/හෝ අන්තරාදායක ඖෂධ නීත්‍යනුකූල නොවන අයුරින් වගා කිරීම, නිෂ්පාදනය, ප්‍රවාහනය, බෙදා හැරීම සහ විකිණීම ඇතුලත් වේ. මේවා රටවල් අතර, කලාප අතර මෙන් ම, රට තුළ විවිධ ප්‍රදේශ හරහා ද ලාභ අපේක්ෂාවෙන් හුවමාරු වේ. මත්ද්‍රව්‍ය වෙළෙඳාමේ නියැලෙන්නන්ගේ ප්‍රධාන උත්ප්‍රේරකය 'මුදල්' වේ. අනෙක් අතට නිෂ්පාදකයා, ප්‍රවාහකයා,

---

1 ජාතික අවදානම් තක්සේරුකරණයේ දී සිදු වන්නේ, මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ අවදානමට රටක් කොතරම් නිරාවරණය වන්නේදැයි හඳුනා ගැනීම හා තක්සේරු කිරීමයි.

බෙදා හරින්නා, වෙළෙන්දා සහ භාවිත කරන්නා එකිනෙකට සම්බන්ධ කරන දාමයක් මෙම මුදල් ගනුදෙනු හරහා නිර්මාණය වේ. මේ ආකාරයෙන් උපයාගන්නා 'අනීතික' නොඑසේනම්, 'කළු මුදල' වලට නීත්‍යනුකූල භාවයක් ආරෝපණය කිරීමේ ක්‍රියාවලිය මුදල් විශුද්ධිකරණය ලෙස සරල ව හැඳින්විය හැකි ය. මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය පියවර 3ක් යටතේ හඳුනාගත හැකි ය.

### 2.1. ස්ථාපනය (Placement):

මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියේ මූලික අදියර මෙයයි. අනීතික ව උපයාගත් මුදල් විධිමත් මූල්‍ය පද්ධතියට එක් කිරීම මෙහිදී සිදුවේ. ගිණුමකට මුදල් තැන්පත් කිරීමක් උදාහරණ ලෙස දැක්විය හැකි ය.

### 2.2. ඇතිරීම (Layering):

විධිමත් මූල්‍ය ප්‍රවාහයට එක් කරන ලද මුදල් තව දුරටත් ගිණුම් අතර මාරු කරමින් සහ වඩාත් සංකීර්ණ ගනුදෙනු සිදු කරමින් මූලාශ්‍රය හඳුනාගත නොහැකි වන ආකාරයට සකස් කිරීම මෙහි දී සිදුවේ. සමස්ත ක්‍රියාවලියේ වඩාත් ම සංකීර්ණ අදියර මෙයයි. ව්‍යාජ ඉන්වොයිසි යොදා ගනිමින් සිදු කරනු ලබන වෙළෙඳ ගනුදෙනු මෙන් ම නාමමාත්‍රික සමාගම්[2] (shell companies) අතර සිදුවන ගනුදෙනු ද උදාහරණ වශයෙන් පෙන්වා දිය හැකි ය. මෙලෙස ගිණුම් කිහිපයක් අතර මුදල් මාරු වූ පසු මුල් මූලාශ්‍රය හඳුනා ගැනීම දුෂ්කර වේ.

### 2.3. ඒකාබද්ධ කිරීම (Integration):

මෙය මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියේ අවසන් අදියරයි. විවිධ ගිණුම්/ස්ථර හරහා මාරු වූ මුදල් අවසානයේ දී නැවත වරක් ස්ථිර අයුරින් විධිමත් මූල්‍ය පද්ධතිය හා ඒකාබද්ධ කිරීම මෙහි දී සිදුවේ. ගේ දොර, ඉඩ කඩම් වැනි නිශ්චල දේපළ අත්පත්කර ගැනීම, මැණික් හා ස්වර්ණාභරණ මිල දී ගැනීම, ආයෝජන සිදු කිරීම වැනි ක්‍රම හරහා මෙම ඒකාබද්ධ කිරීම සිදු කෙරේ.

2 නාමමාත්‍රික සමාගම් (shell companies) යනුවෙන් මෙහි දී හැඳින්වෙන්නේ සැබෑ වශයෙන් ව්‍යාපාර ක්‍රියාකාරකම් කිසිවක නිරත නොවන, භෞතික වත්කම් කිසිවක් නොමැති හුදු ලියාපදිංචියක් පමණක් ඇති සමාගම් වේ.

මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සිය අනීතික කටයුතු හරහා විශාල අයුරින් මුදල් උපයාගන්නා අතර මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය හරහා ඒවා විධිමත් මූල්‍ය පද්ධතියට එක් කරන බව අපට පැහැදිලි ය. එය මූල්‍ය අංශය හරහා පමණක් නොව නිශ්චල දේපළ අනුයෝජිතයින්, මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳුන් වැනි මූල්‍ය නොවන ආයතන හරහා ද සිදු වේ. අනෙක් අතට නීත්‍යනුකූල නොවන අයුරින් උපයන මුදල් විශුද්ධිකරණය කිරීමට හැකියාව පැවතීම තුළ දිගු කාලීන ව සිය ක්‍රියාකාරකම්වල නිරත වීමට අපරාධකරුවන් හට මං විවෘත කර දේ. නොඑසේ නම්, නෛතික බාධා මග හරවමින් සිය නීති විරෝධී ඉපයීම් භුක්ති විඳීමට ඉඩ ලබා දේ. සමස්තයක් ලෙස, මුදල් විශුද්ධිකරණය හා මත්ද්‍රව්‍ය ජාවාරම අතර අන්තර් සම්බන්ධතාවය කරණකොට ගෙන අපරාධකරුවන් සඳහා යෝග්‍ය තෝතැන්නක් නිර්මාණය කර දෙමින් නීති බලාත්මක කරන අධිකාරීන් අභියෝගයට ලක් කෙරේ. එබැවින් එක් අංශයක් සඵලාදායිව මැඩලීම සඳහා අනෙක කෙරෙහි ද අවදානය යොමු විය යුතුම ය.

## 3. මත්ද්‍රව්‍ය ජාවාරමේ විකාශනය

තාක්ෂණය, සන්නිවේදනය, ප්‍රවාහනය ආදියේ මෙන්ම නීති පද්ධතිවල විකසනය සමගින්, ඒවාට අනුගත වෙමින් මත්ද්‍රව්‍ය ජාවාරමේ ස්වරූපය ද කාලානුරූපී ව වෙනස්කම්වලට භාජන වී ඇත. අවුරුදු දහස් ගණනකට පෙර පවා අබිං හා කංසා වෙළෙඳාම පැවති බවට සාධක ඇත. 19-20 ශතවර්ෂවල දී කොකා කෝලා නිෂ්පාදනය සමග කොකේන් ප්‍රචලිත වන්නට විය. එසේ ම, ඇමරිකානු සිවිල් යුද්ධයේ දී, වේදනා නාශකයක් ලෙස මෝෆින් (Morphine) භාවිතයට ගැනුණු අතර 20 වන සියවස වන විට ඒ ආශ්‍රයෙන් හෙරොයින් නිෂ්පාදනය විය. රන් ත්‍රිකෝණය (මියන්මාරය, ලාඕසය, තායිලන්තය) හා රන් චන්ද්‍රවංකය (ඉරානය, ඇෆ්ගනිස්තානය, පකිස්තානය) ඈත අතීතයේ සිටම අබිං හා හෙරොයින් නිෂ්පාදනයට ප්‍රසිද්ධියක් උසුලන අතර වත්මන් ගෝලීය මත්ද්‍රව්‍ය වෙළෙඳාමේ කේන්ද්‍රස්ථානයන් වශයෙන් තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී. ශ්‍රී ලංකාව මෙම කලාප දෙක මධ්‍යයේ, නාවික ප්‍රවාහන මාර්ගය මධ්‍යයේ පිහිටීම හේතුවෙන්

ගෝලීය මත්ද්‍රව්‍ය ජාවාරමේ ප්‍රධාන සංධිස්ථානයක් බවට පත් ව තිබේ.

21 වන සියවස වනවිට සාම්ප්‍රදායික වෙළෙඳපොළ සංකල්පයෙන් ඔබ්බට ගොස්, සමාජ මාධ්‍ය හරහා මෙන් ම darkweb[3] හරහා ද අතත්‍ය මුදල් (Virtual Currency) භාවිත කරමින් මත්ද්‍රව්‍ය වෙළෙඳාම සිදු වේ. එමතු ද නොව, සන්නිවේදනය සහ ප්‍රවාහනය සඳහා ද ජාවාරම්කරුවෝ වර්තමානයේ දී වඩාත් සංකීර්ණ උපක්‍රම භාවිත කරති. උදාහරණ වශයෙන්;

- සන්නිවේදන කටයුතු සඳහා චන්ද්‍රිකා තාක්ෂණය සහිත දුරකතන මෙන් ම වඩාත් සුරක්ෂිත දුරකතන සන්නිවේදන යෙදවුම් භාවිත කිරීම.
- සම්ප්‍රදායික පොලිස් මාර්ග බාධක ආදිය මගහරිමින් ප්‍රවාහනය සිදු කිරීම සඳහා ඩ්‍රෝන තාක්ෂණය යොදා ගැනීම
- නාවික මාර්ග හරහා මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම පිණිස වතුර යටින් නමුත්, මතුපිටට ආසන්නයෙන් ගමන් කරන දියුණු යාත්‍රා (Narco-Submarines and semi submersibles) යොදා ගැනීම.
- සැඟවුණු කුටීර සහිත වාහන සහ රටවල් අතර හුවමාරු කිරීම් සඳහා උමං මාර්ග යොදා ගැනීම
- වරාය හෝ ගුවන් තොටපොළ හරහා ප්‍රවාහනය කිරීමේ දී වඩාත් ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කිරීම (පුද්ගලයන් විසින් ආමාශයේ හෝ ගුද මාර්ග යේ සඟවාගෙන යෑම, ටින් කරන ලද කෑම වර්ග, විසළි පලතුරු, සීනි ආදිය සමග මිශ්‍ර කර ප්‍රවාහනය කිරීම වැනි)
- කේතනය කරන ලද භාෂා යොදා ගනිමින් සමාජ මාධ්‍ය හා අන්තර්ජාලය හරහා වෙළෙඳාම් කිරීම
- නීති බලාත්මක කරන ආයතනවල විශ්ලේෂණ හා විමර්ශන ක්‍රම අවබෝධ කර ගැනීම පිණිස විවිධ දත්ත විශ්ලේෂණ ක්‍රම යොදා ගැනීම

මත්ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම සඳහා නව ක්‍රමෝපායන් කාලයත් සමග වෙනස් වූවා සේම ඒවායින් ජනිත වන මුදල්, විශුද්ධිකරණය සඳහා යොදා ගන්නා ශිල්ප ක්‍රමයන් ද කාලානුරූපී ව වෙනස් වී ඇත.

- අතත්‍ය මුදල් භාවිතයෙන් ගනුදෙනු සිදු කිරීම.
- ඉතා සංකීර්ණ මූල්‍ය ගනුදෙනු සිදු කිරීම.
- Shell සමාගම් නමින් විවෘත කරනු ලබන ගිණුම් අතර ගනුදෙනු සිදු කිරීම (මෙහිදී ගිණුමකින් ගිණුමකට මුදල් මාරු වුව ද, සැබෑ වශයෙන්ම ඊට පාදක වූ භාණ්ඩ/සේවා හුවමාරුවක් සිදු නොවේ)
- තෙවන පාර්ශ්වයන් යොදාගෙන ගිණුම් විවෘත කිරීම (බොහෝවිට ආර්ථික ශක්‍යතාවය අඩු කම්කරුවන් වැනි පුද්ගලයන් හට යම් මූල්‍ය ප්‍රතිලාභයක් ලබා දී ඔවුන් ලවා ගිණුම් විවෘත කරවාගෙන ඒ හරහා ගනුදෙනු සිදු කිරීමෙන් ගිණුම්වල සැබෑ පරිශීලකයන් සොයා ගැනීම අසීරු වේ)

ආදිය උදාහරණ ලෙස දැක්විය හැකි ය.

## 4. තාක්ෂණික දියුණුව සහ මුදල් විශුද්ධිකරණය

අපරාධකරුවෝ, විශේෂයෙන් ම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෝ ස්වකීය මුදල්වල අනීතික මූලාශ්‍රය සැඟවීම සඳහා තාක්ෂණික දියුණුව අවභාවිත කරති. මුදල් විශුද්ධිකරණ පරිචය තුළ බහුල ව ම යොදා ගැනෙන එවැනි ක්‍රමවලට නිදසුන් කිහිපයක් පහත පරිදි දැක්විය හැකි ය.

### 4.1. අතත්‍ය මුදල් (Virtual Currency) භාවිතය:

Bitcoin වැනි අතත්‍ය මුදල් මෑත කාලීන ව නීති විරෝධී ගනුදෙනු සඳහා බහුල ව ම යොදා ගැනෙන මාධ්‍යයක් බවට පත් ව ඇත. මෙවන් ගනුදෙනු නියාමනය කිරීමට බලයලත් ආයතනයක් නොමැති වීමෙන් මෙම ගනුදෙනු හඳුනා ගැනීම සහ අරමුදල් අත්පත් කර ගැනීම (නීති විරෝධී අරමුදල් රාජසන්තක කිරීම) බලධාරීන් හට අභියෝගාත්මක වී තිබේ. තව ද, monero වැනි පෞද්ගලික අතත්‍ය මුදල් භාවිතය සමග නිර්නාමික ව ගනුදෙනු සිදු කිරීමට තව දුරටත් පහසුකම් සැළසේ.

3 Dark web යනු, විශ්ව විසිරි වියමනෙහි (World Wide Web); විශේෂ මෘදුකාංග හරහා පමණක් ප්‍රවේශ විය හැකි, එමෙන්ම, අනන්‍යතාව සඟවමින් කටයුතු කළ හැකි කොටස වේ.

### 4.2. ඩිජිටල් ගෙවීම් පද්ධති (Digital Payment Systems):

ඩිජිටල් ගෙවීම් මාධ්‍යයන් හරහා ඉතා ඉක්මනින් සහ සාපේක්ෂ ව අනන්‍යතාව සඟවමින් ගනුදෙනු සිදු කිරීමට හැකි වීම තුළ අපරාධකරුවන්හට මුදල් විශුද්ධිකරණයට පහසු වී ඇත.

### 4.3. අන්තර්ජාලය හරහා සිදුවන සූදු සහ පරිගණක ක්‍රීඩා:

අන්තර්ජාලය හරහා ක්‍රියාත්මකවන කැසිනෝ සහ පරිගණක ක්‍රීඩා හරහා මුදල් විශුද්ධිකරණය කිරීමට අපරාධකරුවන්ට ඉඩ ප්‍රස්තා සැළසේ. අනීතික මුදල් යොදාගෙන සූදු/ක්‍රීඩාවේ නිරත වීමෙන් ජයග්‍රහණය කරනු ලබන අරමුදල්වලට නිතැතින් ම නීත්‍යානුකූල බවක් ආරෝපණය වේ.

### 4.4. shell සමාගම් සහ එතෙර බැංකු ඒකක:

වර්තමාන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ දියුණුව සමග shell සමාගම් පාලනය සහ එතෙර බැංකු ඒකකවල[4] ගිණුම් පවත්වාගෙන යාම වඩාත් පහසු වී ඇත. ඒ හරහා, එම සමාගම්වල සැබෑ හිමිකරුවන් කව්රුන්ද යන වග සහ අරමුදල්වල මූලාශ්‍රය සඟවමින් ගනුදෙනු සිදු කිරීමට අපරාධකරුවන් හට අවස්තාව සැළසේ.

### 4.5. ජංගම දුරකතන හරහා ගෙවීම් කිරීම:

විද්‍යුත් මුදල් පසුම්බි (e-wallets) වැනි විවිධ ජංගම දුරකතන යෙදවුම් හරහා ක්ෂණික ව ගෙවීම් සිදු කිරීමට පවතින හැකියාව අපරාධකරුවන් විසින් අනන්‍යතාව සඟවමින් ගනුදෙනු සිදු කිරීම සඳහා බහුල ව ම යොදා ගැනේ. මේ හේතුවෙන්, ගනුදෙනු දාමයක් විශ්ලේෂණය කිරීමේ දී සම්බන්ධිත පාර්ශ්වයන් හඳුනාගැනීම විමර්ශන නිලධාරීන් හට අභියෝගාත්මක වේ.

4 එතෙර බැංකු ඒකක (Offshore Banking Unit) යනු, බැංකු විසින් සිය දේශ සීමාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන බැංකු ඒකක වේ. මෙම බැංකු ඒකකවලට අදාළ වන රෙගුලාසි සාපේක්ෂව ඉතා ලිහිල් සහ අවම වේ.

## 5. ගෝලීයකරණය අභියෝගයක් ද ?

ගෝලීයකරණය කරණ කොටගෙන කලාප අතර මෙන් ම රටවල් අතර සම්බන්ධතා වර්ධනය වීම හේතුවෙන්, මත්ද්‍රව්‍ය නිෂ්පාදනය, බෙදා හැරීම හා විකිණීම සඳහා සම්බන්ධතා ජාල ගොඩනගා ගැනීමට හැකි වීම තුළ ජාවාරම්කරුවන්ගේ කටයුතු ද පුළුල් වී ඇත. එසේ ම වෙළෙඳපොළ පුළුල් වීම, ප්‍රවාහන කටයුතු පහසු වීම, කෘත්‍රිම මත්ද්‍රව්‍ය (synthetic drugs) සැකසීමට අවශ්‍ය අමු ද්‍රව්‍ය පහසුවෙන් සොයාගත හැකි වීම ගෝලීයකරණයේ අනෙකුත් ප්‍රතිවිපාක අතර වේ.

විශේෂයෙන් ම, ඒකාබද්ධ වූ ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ හේතුවෙන් සිය අනීතික මුදල් විශුද්ධිකරණය කිරීමට ද මැනවින් ඉඩකඩ සැළසී ඇත. මූල්‍ය පද්ධතීන් අතර මෙම ඒකාබද්ධ වීම හේතුවෙන් අන්තර්ජාතික දේශ සීමා හරහා පහසුවෙන් මුදල් මාරු කිරීම මෙන් ම එම මුදල්වල මූලාශ්‍රය සැඟවීම පහසු වී ඇත. කෙටියෙන් පවසතොත්, ගෝලීයකරණය හේතුවෙන් මත්ද්‍රව්‍ය ජාවාරම වඩාත් සංකීර්ණ අන්තර්ජාතික සංසිද්ධියක් බවට පරිවර්තනය වී ඇත. එබැවින් නීතිය බලාත්මක කරන ආයතන වෙත නව අභියෝග එල්ල කර ඇති අතර මත්ද්‍රව්‍ය ජාවාරමට එරෙහි ව ඵලදායී ලෙස සටන් කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රවේශයක අවශ්‍යතාව පෙන්වා දී තිබේ.

මේ නිසා මුදල් විශුද්ධිකරණයට වැට බැඳීම හරහා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අක්‍රිය කිරීම පිණිස රටවල් අතර මනා සම්බන්ධීකරණයක් අවශ්‍ය වේ. වෙනත් ආකාරයකින් සඳහන් කරන්නේ නම්, මත්ද්‍රව්‍ය ජාවාරම ජාත්‍යන්තර ව ව්‍යාප්ත වී ඇති තත්ත්වයක් තුළ මුදල් විශුද්ධිකරණය පිටු දැකීමට නම් රටවල් අතර සහයෝගිතාව තර කර ගැනීම සහ බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම අතිශය වැදගත් වේ.

## 6. නියාමකයන්ගේ ප්‍රතිචාර කෙබඳු විය යුතුද?

වර්තමානය වනවිට මත්ද්‍රව්‍ය ජාවාරම සහ මුදල් විශුද්ධිකරණය මැඩ පැවැත්වීම සඳහා සියලු රාජ්‍යයන් මෙන් ම අන්තර්ජාතික ආයතන සක්‍රිය ව සම්බන්ධ වී සිටිති. ඔවුන්ගේ ක්‍රියාමාර්ග අතර පහත දෑ ප්‍රධාන වේ.

**6.1 මූල්‍ය කාර්ය සාධක බලකාය:**

මූල්‍ය කාර්ය සාධක බලකාය යනු, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ ජාත්‍යන්තර මූල්‍ය පද්ධතියේ අඛණ්ඩතාවට එරෙහි වෙනත් තර්ජනවලට එරෙහි ව සටන් කිරීම සඳහා ගෝලීය ප්‍රමිත සකසන අන්තර් රාජ්‍ය සංවිධානයකි. සාමාජික රටවල් මෙම ප්‍රමිතීන් ක්‍රියාත්මක කරන අතර අනුකූලතාව තක්සේරු කිරීම සඳහා අන්‍යෝන්‍ය ඇගයීම්වලට භාජන වේ.

**6.2 නීති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම:**

සෑම රජයයක්ම පාහේ මත්ද්‍රව්‍ය ජාවාරම හා මුදල් විශුද්ධිකරණය අපරාධමය වැරදි ලෙස නීතියට එක්කොට තිබේ. එසේම මූල්‍යමය ගනුදෙනුවල විනිවිදභාවය ඉහළ නැංවීම සහ සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීම වෙනුවෙන් නෛතික ප්‍රතිපාදන සපයා දී තිබේ.

**6.3 ජාත්‍යන්තර සම්මුතීන් සහ ගිවිසුම් ඇති කර ගැනීම:**

මත්ද්‍රව්‍ය ජාවාරම හා සම්බන්ධ එක්සත් ජාතීන්ගේ වියානා සම්මුතිය වැනි විශ්ව සම්මුතීන් සහ රටවල් අතර ඇති කරගනු ලබන ද්වි පාර්ශ්වික හෝ බහු පාර්ශ්වික ගිවිසුම් මින් අදහස් වේ.

**6.4 වත්කම් රාජසන්තක කිරීම සහ අත්පත් කර ගැනීම:**

මත්ද්‍රව්‍ය ජාවාරමෙන් සහ මුදල් විශුද්ධිකරණයෙන් උපයාගත් වත්කම් රාජසන්තක කිරීමට රජයන් නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කරයි. වත්කම් රාජසන්තක කිරීමේ නීති මගින් අපරාධ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ දේපළ, බැංකු ගිණුම් සහ අනෙකුත් වත්කම් රාජසන්තක කිරීමට බලධාරීන්ට ඉඩ සලසයි.

**6.5 දේශසීමා පාලනය සහ රේගු බලාත්මක කිරීම:**

මත්ද්‍රව්‍ය හෝ ඒවායින් ලද මුදල් දේශ සීමා අතර හුවමාරු කිරීමේ ප්‍රයත්නයන් මැඩලීම සහ එවන් උත්සාහයන් නීතියේ රැහැනට හසුකර ගැනීම පිණිස දේශ සීමා අතර සිදු කරන ආගමන විගමන පරීක්ෂා කිරීම් කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් හා තාක්ෂණය අදාළ නිලධාරීන් හට සපයා දීම ඉතා වැදගත් වේ.

**6.6 දූෂණයට එරෙහි නීති බල ගැන්වීම:**

දූෂණය හා අල්ලස මගින් මුදල් විශුද්ධිකරණයට ඉඩ සැළසෙන නිසා දූෂණ විරෝධී ප්‍රයත්න ක්‍රියාත්මක කිරීම මුදල් විශුද්ධිකරණයට එරෙහි සටනේ දී ඉතා වැදගත් වේ.

මත්ද්‍රව්‍ය ජාවාරම හා මුදල් විශුද්ධිකරණ පරිචය තුළ ඇති වී තිබෙන ඉහත ප්‍රවණතා සළකා බැලීමේ දී, මත්ද්‍රව්‍ය ජාවාරම හා සම්බන්ධ වැරදි විමර්ශනය කිරීමේ දී ඒ හා සමගාමී ව මූල්‍ය විමර්ශනයක් ද සිදු කිරීමේ අවශ්‍යතාව මොනවට පැහැදිලි වේ. විශේෂයෙන් ම, අතථ්‍ය වත්කම් (virtual assets) සහ darkweb ඇතුළු නව තාක්ෂණය පිළිබඳ දැනුමැති විමර්ශකයන් විසින් සිදු කෙරෙන එවන් විමර්ශන හරහා වරදකරුවන් හඳුනාගෙන අධිකරණය හමුවට පැමිණවීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම හා සඵලදායී වනු ඇත. එසේ ම, මූල්‍ය හා මූල්‍ය නොවන ආයතන විසින් ගනුදෙනුවල නියැලීමේ දී සිය ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් මනා සැලකිල්ලෙන් කටයුතු කිරීම, ගනුදෙනුකරු හඳුනා ගැනීමට අදාළ නිර්දේශයන්/නීති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, සැක කටයුතු ගනුදෙනු පිළිබඳ වාර්තා මූල්‍ය බුද්ධි ඒකකය වෙත යොමු කිරීම ආදිය ද, මත්ද්‍රව්‍ය ජාවාරම හා ඒ හා සම්බන්ධ මුදල් විශුද්ධිකරණය මැඩලීමෙහි ලා ඉතාමත් වැදගත් වේ.



# නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සහ නව ශ්‍රී ලංකා මහ බැංකු පනත: සරල විග්‍රහයක්

කේ ඒ ඩී ඒ ඒකනායක
ජ්‍යේෂ්ඨ ගණකාධිකාරී,
මූල්‍ය දෙපාර්තමේන්තුව

## 01. හැඳින්වීම

දේශීය මිල ස්ථායිතාව අත්කර ගැනීම සහ එය පවත්වාගෙන යෑම, ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණ වශයෙන්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් හඳුනාගෙන ඇත. 2023 සැප්තැම්බර් මස 15 දින සිට ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන ක්‍රියාත්මක වුව ද, මෙයට පෙර පැවති 1949 අංක 58 දරන මුදල් නීති පනතින් ද[1], ශ්‍රී ලංකාව තුළ ආර්ථික සහ මිල ස්ථායිතාව පවත්වාගෙන යෑමේ වගකීම දරන ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව හඳුනාගෙන තිබිණි.

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාව තුළ දේශීය මිල ස්ථායිතාවය අත්කර ගැනීම සහ පවත්වාගෙන යෑම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම ආර්ථිකයේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය තීරණය කිරීම සහ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරනු ලබයි. මෙම පොලී අනුපාතික ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මෙහෙයුම් කටයුතු කෙරෙහි බලපාන අතර, එය ණයගැතියන් (Debtors) සහ ණය හිමියන් (Creditors) ගේ හැසිරීම, ආර්ථික ක්‍රියාකාරකම් සහ ඒ අනුව අවසන් වශයෙන් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ උද්ධමන අනුපාතිකය මත සෘජු සහ වක්‍ර වශයෙන් බලපෑම් ඇති කරනු ලබයි. මේ සඳහා 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් උද්ධමන ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා එය ස්ථාවර ඉලක්කයක පවත්වාගෙන යෑම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ (Flexible inflation targeting) රාමුවකට අනුකූල ව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි.

## 02. මුදල් ප්‍රතිපත්ති රාමුව: මෑත කාලීන විකාශනය කෙටියෙන්

### දේශීය වශයෙන් විකාශය:

2.1 මීට දශක කිහිපයක සිට, එනම් 1980 දශකයේ ආරම්භක අවස්ථාවේ සිට, සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ඉලක්කකරණය භාවිත කර ඇත. එහි දී, මුදල් සමස්තය, මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන භාවිත විචල්‍යය ලෙස යොදාගෙන ඇත. තව ද, මුදල් ඉලක්කකරණ රාමුවට අනුව, මිල ස්ථායිතාව සඳහා බලපාන ප්‍රධාන ම සාධකය ලෙස මුදල් සැපයුමේ වෙනස් වීම සලකා බලා ඇති අතර, මුදල් සැපයුමට අදාල සංරචකය වශයෙන් සංචිත මුදල් (reserve money)[2] සහ පුළුල් මුදල් (broad money)[3] භාවිතයට ගෙන ඇත. මෑත ඉතිහාසයේ සිදු කරන ලද ආර්ථික විද්‍යාත්මක අධ්‍යයනවලට අනුකූල ව, මුදල් සමස්තය අතුරින්, මුදල් සැපයුම සහ පොදු

1 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් 2023 සැප්තැම්බර් මස 14 දින සිට බලපැවැත්වෙන පරිදි මුදල් නීති පනත ඉවත් කර ඇත.

2 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ව්‍යවහාර මුදල් සහ මහ බැංකුව වෙතැති වාණිජ බැංකු සහ තැන්පතුවල එකතුව.

3 මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් සහ වාණිජ බැංකු වෙතැති මහජනයා සතු තැන්පතුවල එකතුව.

මිල මට්ටම් අතර පවතින සම්බන්ධතාව පිළබඳ විශ්ලේෂණය කිරීම සඳහා සුදුසුම විචල්‍යය ලෙස පුළුල් මුදල් සැපයුම (broad money supply) හඳුනාගෙන ඇත.

2.2 මෑත කාලයේ දී මුදල් සැපයුම සහ උද්ධමනය අතර පවතින සබඳතාව අවම වීම හේතුවෙන් හා ඊට සමගාමී ව සිදුවූ අනෙකුත් ආර්ථික විචල්‍යයන්ගේ වෙනස්වීම් ද සළකා බලා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය වැඩි දියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ මෙහෙයුම් ඉලක්කය ලෙස සංචිත මුදල් වෙනුවට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (Average Weighted Call Money Rate) භාවිතයට ගනු ලැබිණි. මහ බැංකුව සිය අභ්‍යන්තර කටයුතු සඳහා (මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට) භාවිත කරන ප්‍රධාන අතරමැදි දර්ශකය ලෙස පුළුල් මුදල් සමස්තය තවදුරටත් යොදා ගන්න අතර, මුදල් වැඩසටහන සකස් කිරීමේ දී රාජ්‍ය මුදල් අංශයේ සහ ගෙවුම් තුලනයේ අපේක්ෂිත වර්ධනයන් අපේක්ෂිත මෙන්ම උද්ධමන ඉලක්ක සහ මූර්ත ආර්ථික වර්ධනයද සලකා බලනු ලබයි.

2.3 එහෙත්, සිය අභ්‍යන්තර කටයුතු සඳහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ කරගන්නා ප්‍රධාන අතරමැදි දර්ශක විචල්‍ය ලෙස පුළුල් මුදල් සමස්තය තව දුරටත් යොගන්නා අතර, මෙම අභ්‍යන්තර ප්‍රයෝජනය සඳහා සකස් කනරනු ලබන මුදල් වැඩසටහන සඳහා, රාජ්‍ය මුදල් අංශයේ සහ ගෙවුම් තුලනයේ අපේක්ෂිත වර්ධනයන් වැනි ආර්ථිකයේ අනෙකුත් අංශවල ප්‍රවනතා මෙන් ම අපේක්ෂිත උද්ධමන ඉලක්ක සහ මූර්ත ආර්ථික වර්ධනයද සලකා බැලේ.

2.4 සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික මඟින්, එනම් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය[4] (Standing Deposit Facility Rate) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය[5] (Standing Lending Facility Rate) යන පොලී අනුපාතිකයන්ගෙන් යුක්ත වූ පොලී අනුපාතික කොරිඩෝව තුළ, විවිධ වෙළෙඳ පොළ කටයුතු සිදු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උද්ධමනය අපේක්ෂිත මට්ටමේ පවත්වාගෙන යාම සිදු කරනු ලබයි.

### විදේශීය ප්‍රවනතා:

2.5 මුදල් ප්‍රතිපත්තියේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා, ආර්ථිකයේ, එනම් මිල ස්ථායිතාව පවත්වාගෙන යෑම සඳහා ලොව බොහෝ රටවල් විශේෂයෙන්ම සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස උද්ධමන ඉලක්කකරණය (Inflation Targeting) තෝරාගෙන ඇත (IMF, 2005)[6]. මේ සම්බන්ධයෙන් හේතු වූ කරුණු අතර, ප්‍රධාන වශයෙන් ම පෙනී ගොස් ඇත්තේ මුදල් ඉලක්කරණ (Monetary Targeting) රාමුව යටතේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී අවසාන ඉලක්ක විචල්‍ය සහ අතරමැදි නාමික විචල්‍ය අතර ශක්තිමත් විශ්වසනීය සම්බන්ධතාවක් ඇති බවට සිදු කරන ලද උපකල්පන කෙසේ වෙතත් එම සම්බන්ධතාව දුර්වල වන අවස්ථාවන්හි දී මුදල් සමස්ත ඉලක්කකරණය අපේක්ෂිත අන්දමින් සිදු නොවීමයි.[7] මෙය මුදල් ප්‍රතිපත්තිය හැසිරවීමෙන් බලාපොරොත්තු වන ප්‍රතිපල ලඟාකර ගැනීමට බාධා එල්ල කල හැකි තත්ත්වයක් ලෙස හඳුනාගැනීම තුළ, පෙර සඳහන් උද්ධමන ඉලක්කකරණය වෙත විවිධ රටවල් යොමු වීමේ ප්‍රවණතාව ඇරඹිනි.

## 03. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව

3.1 නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යනු, රටක මූල්‍ය අධිකාරිය (Monetray Authority/Central Bank) විසින් ඉතා පැහැදිලිව ම ප්‍රකාශයට පත් කර, මෙන් ම නෛතික වශයෙන් වගකීමකින් යුතු ව, කිසියම් කාලපරාසයක් තුළ යම්කිසි සංඛ්‍යානමය උද්ධමන ඉලක්කයක් හඳුනාගෙන,

4 මින් පෙර ප්‍රතිමිලදී ගැනුම අනුපාතිකය ලෙස හඳුන්වනු ලැබිණි. (Repo rate)

5 මින් පෙර ප්‍රතිවිකුණුම් අනුපාතිකය ලෙස හඳුන්වනු ලැබිණි. (Reverse Repo rate)

6 IMF, "Does Inflation Targeting Work in Emerging Markets?", World Economic Outlook, September 2005.

7 ශ්‍රී ලංකා මහ බැංකුව, "ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුව නවීකරණය කිරීම: විශේෂ සටහන 10", "වාර්ෂික වාර්තාව", 2015.

එම ඉලක්කය සපුරා ගැනීම සහ එය පවත්වාගෙන යෑම වෙනුවෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම් සිදු කරන ලබන රාමුවයි. බර්නැන්කේට (2001) අනුව

**සංඛ්‍යා සටහන 01 : උද්ධමන ඉලක්කකරණ රාමුව අනුගමනය කරන රටවල්[8]**

| රට | උද්ධමන ඉලක්කකරණ රාමුව ආරම්භ කළ වර්ෂය |
|---|---|
| නවසීලන්තය | 1982 |
| කැනඩාව | 1991 |
| එක්සත් රාජධානිය | 1992 |
| ස්වීඩනය | 1993 |
| චෙක් ජන රජය, ඊශ්‍රායලය | 1997 |
| පෝලන්තය | 1998 |
| බ්‍රසීලය, චිලී, කොලොම්බියාව | 1999 |
| දකුණු අප්‍රිකාව, තායිලන්තය | 2000 |
| අයිස්ලන්තය, මෙක්සිකෝව, නෝර්වේ | 2001 |
| පේරූ, පිලිපීනය | 2002 |
| ග්වාතමාලාව, ඉන්දුනීසියාව, රොමේනියාව | 2005 |
| ආර්මේනියාව, තුර්කිය | 2006 |
| ඝානාව | 2007 |
| ජෝර්ජියාව, සර්බියාව | 2009 |
| එක්සත් ජනපදය | 2012 |
| ජපානය | 2013 |
| රුසියාව | 2014 |
| කසකස්ථානය, යුක්රේනය | 2015 |
| ආර්ජන්ටිනාව, ඉන්දියාව | 2016 |

8 Musthafa, M. T., Le T., Suardi S., "Monetary Policy Transmission in Sri Lanka", Applied Economics, 56:2, 151-168, DOI, January 2023.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යනු රටක මුදල් ප්‍රතිපත්ති රාමුව ම වන අතර, නිලවශයෙන් ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යානමය උද්ධමන ඉලක්කය (හෝ ඉලක්ක ගත පරාසය), එම අවස්ථාවේ පවත්නා ප්‍රතිපත්තිමය හෝ නෛතික මෙවලම් (instruments) උපයෝගී කර ගෙන ලඟා කර ගැනීම සහ පවත්වාගෙන යෑම වේ.

3.2 පෙර සඳහන් කළ පරිදිම, බොහෝ රටවල මුදල් අධිකාරීන් විසින්, 1990 දශකයටත් පෙර සිට ම නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස භාවිත කිරීම ඇරඹිනි. මෙහි දී මූලිකත්වය ගන්නා ලද්දේ නවසීලන්තයේ සංචිත බැංකුව (1989) වන අතර, ජපානය, එක්සත් ජනපදය සහ යුරෝපයේ මහ බැංකු ඉන් ආභාෂය ලැබූ අනෙකුත් මුදල් අධිකාරීන් වේ. මේ වන විට එසේ උද්ධමන ඉල්ක්කකරණ රාමුව සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස යොදාගන්නා ප්‍රධාන රටවල් ලැයිස්තුවක් පහත සංඛ්‍ය සටහන 01 හි කෙටියෙන් දක්වා ඇත.

3.3 තවද, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව විසින් නිමැවුම් (output) හෝ සේවාවියුක්තිය (unemployement) වෙනුවට, උද්ධමනය සිය මුදල් ප්‍රතිපත්තියේ මූලික පරමාර්ථය බවට පත් කරගනී. මෙම තත්ත්වය යටතේ රටක උද්ධමනය ආර්ථිකය වෙත බලපෑම් කිරීමට පෙර මිල දර්ශකයන්හි වෙනස්වීම් පුරෝකථනය කිරීමට ද, මිල දර්ශකයන්හි වෙනස්වීම් පුරෝකථනය කිරීම මගින් රටක මුදල් අධිකාරිය හට උද්ධමනය ස්ථිර පදනමකින් පවත්වාගෙන යෑමට අත්‍යවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමට ද හැකියාව උදාවේ (*Agénor" et al*, 2000). ඒ අනුව, උද්ධමන ඉලක්ක අත්පත්කර පවත්වාගෙන යෑම වෙනුවෙන් මුදල් අධිකාරීන් නෛතික වශයෙන් වගකීමකට ලක්වන අතර, එවැනි විනිවිදභාවයෙන් සහ වගවීමකින් යුක්ත ක්‍රියාවලියක් රටක ආර්ථික මෙහෙයුම් පද්ධතිය තුළ පැවතීම ඉතාම වැදගත් වේ. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස යොදා ගැනීමෙන්

පසු, එසේ යොදාගත් බොහෝ රටවල උද්ධමනය ක්‍රමයෙන් අඩු වූ බව පෙනෙන්නට තිබින[9].

3.4 ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සිදු කරන ලද අධ්‍යනයන්ට අනුකූල ව උද්ධමන ඉලක්කකරණය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස යොදා ගැනීමෙන් පහත සඳහන් කරුණු මූලික වශයෙන් සපුරා ගැනීමට හැකියාවක් පවතී.

(i) උද්ධමනය මැදි තනි අගයක සහ ස්ථාවර අගයක පවත්වාගෙන යෑම වෙනුවෙන් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිමේ දී, ඉතා කෙටිකාලීන ව මෙන්ම මුදල් අධිකාරියකට යෝග්‍ය නොවන මැදිහත් වීම් සිදුවීම අවම කරගැනීමට උද්ධමන ඉලක්කකරණය උපකාරී වන බැවින්, සාර්ව ආර්ථික ස්ථායිතාව යටතේ ආර්ථික වර්ධනයටත් එමඟින් ධනාත්මක බලපෑමක් එල්ලවිය හැකි ය.

(ii) උද්ධමන ඉලක්කකරණය විසින් වැඩිදුර වගවීමක් සහ විනයක් එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නා වූ ආයතන වෙතින් බලාපොරොත්තු වේ.

(iii) උද්ධමනය පාලනය කිරීමේ විශ්වසනීයත්වය සුරකිමින් ද, දිගු කාලීන බලපෑම් අවම කරමින් ද, කෙටිකාලීන උද්ධමන තත්ත්වයන්හට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව මෙමඟින් මුදල් අධිකාරීන් වෙත ලබාදීම.

(iv) නිරුද්ධමන තත්ත්වයක් (context of disinflation) වැනි විශේෂ අවස්ථාවක දී හෝ වෙනත් එවැනි අවස්ථාවක දී මුදල් අධිකාරීන්හට සිය ආයතනික ප්‍රතිසංස්කරණ සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීමට උද්ධමන ඉලක්කකරණය සහාය වේ. ( Schaechter" et al, 2000)

(v) උද්ධමනය මැනීමට විවිධ ඉලක්ක විචල්‍යයන් භාවිත කිරීම හේතුවෙන්, උද්ධමන ඉලක්කකරණයට අනුව ප්‍රශස්ථ මට්ටමින් තොරතුරු රැසක්, තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී මුදල් අධිකාරින්ට ලබා දීම සිදු වේ.

(vi) සාර්ව ආර්ථික විචල්‍යයන් ස්ථාවර ආර්ථික තත්ත්වයන් තුළ ක්‍රියාත්මක වීම හේතුවෙන්, උද්ධමන ඉලක්කකරණය දුබල අයුරින් ක්‍රියාත්මක වන රටවල් වලට ඉතා හොඳින් ක්‍රියාකරන රටවල් සමග ඉදිරියට යෑමට අවස්ථාව සැලසේ. (Ball and Sheridan, 2003)

(vii) දකුණු අප්‍රිකාව වැනි රටවල් සිය රටෙහි මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව (financial system stability) තහවුරු කිරීම උදෙසා උද්ධමන ඉලක්කකරණ රාමුව භාවිතය හේතුවෙන්, එම රටවල ආර්ථික සංවර්ධනයට එයට ම අනන්‍යවූ ප්‍රතිලාභ රැසක් ලබා දී ඇත. (Behokla and Myburgu, 2002).

3.5 එහෙත්, ඇතැම් අවස්ථාවන්හි දී උද්ධමන ඉලක්කකරණ රාමුව යොදැගැනීමේ දී සිදුවිය හැකි අවාසි ලෙස පහත සඳහන් කරුණු හඳුනා ගැනීමට හැකියාවක් ද පවතී.

(i) උද්ධමන ඉලක්කකරණය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස යොදාගැනීමට පෙරාතුව ඉටු කළ යුතු ආයතනික, නෛතික සහ මෙහෙයුම් ක්‍රමවේදයන්හි මූලික වෙනස්කම් කිහිපයක් ඇති අතර, එම අවශ්‍යතාවන් ඉතා කෙටි කලකින් සපුරාලීම එතරම් පහසු කටයුත්තක් නොවීම.

(ii) උද්ධමන ඉලක්කකරණ රාමුව අනම්‍ය වීම හේතුවෙන් මූල්‍ය විචල්‍යයන්ගේ අස්ථාවරත්වයක් ඇති වුවහොත්, එම තත්ත්වය තුළින් රාජ්‍ය මූල්‍ය තත්ත්වය, විචක්ෂණශීලී රාජ්‍ය මූල්‍ය කළමණාකරණය සහ විනිමය අනුපාතිකයේ ස්ථාවරත්වය වෙත ඍණාත්මක බලපෑම් ඇති විය හැකිය.

9 Perera, R. A. A., “Is Sri Lanka Ready for Inflation Targeting?”, Central Banking and Financial Markets, Central Bank of Sri Lanka Inaugural International Research Conference, 2010.

(iii) උද්ධමන අපේක්ෂාවන් මැනීම සඳහා භාවිත කරනු ලබන ඉලක්ක විචල්‍යන් වන මිල දර්ශකයන්හි ඇතුළත් සෑම කරුණක් වෙත ම බලපෑම් කිරීමට මුදල් අධිකාරින්ට හැකියාවක් නොමැති වීම.

(iv) ඇතැම් ආර්ථික විශ්ලේෂණයන්ට අනුකූල ව උද්ධමන ඉලක්කකරණය, ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය මනිනු ලබන උද්ධමනය හෝ නිමැවුම් හෝ පොලී අනුපාතිකයන්ගේ හැසිරීමට ධනාත්මක ව බලපාන බවට සාධක නොමැත (Ball and Sherdan, 2003).

3.6 කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2017 ජනවාරි මාසයේ දී සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කරණ යොදා ගැනීමට අදහස් කරන බව නිවේදනය කරන ලද අතර, එහි ප්‍රධාන අරමුණු ලෙස සඳහන් කරන ලද්දේ තිරසර පදනමකින් යුතු ව මැදි කාලීන ව අඩු සහ ස්ථාවර උද්ධමනයක් ආර්ථිකය තුළ පවත්වාගෙන යෑමයි

3.7 ඒ අනුව, සාර්ථක ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය ක්‍රියාවට නැංවීමේ දී මූලික අවශ්‍යතාවක් ලෙස උද්ධමන ඉලක්කය තීරණය කිරීම උදෙසා සුදුසු උද්ධමනය මැනීමේ මිනුම් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නාගරික මිල දර්ශකය සහ ජාතික මිල දර්ශකය තෝරාගෙන ඇත. එම තෝරාගැනීම් සඳහා පදනම් ලෙස සලකා ඇත්තේ විචල්‍යතාව, පුරෝකථනය කිරීමේ හැකියාව, කම්පනයකින් පසු උද්ධමනය නැවත දිගු කාලීන සමතුලිතය කරා ළඟා වීමට දක්වන ප්‍රවණතාව, උද්ධමන අපේක්ෂා සමඟ පවතින සම්බන්ධතාව සහ තෝරා ගන්නා මිල දර්ශකය අඛණ්ඩ ව පවතිනවාද යන කරුණු වේ.

3.8 තව ද, උද්ධමන ඉලක්කකරණය සඳහා වෙනත් බොහෝ රටවල් සේ ම ශ්‍රී ලංකාව ද ඉලක්කකරණ මිනුම ලෙස පාරිභෝගික මිල දර්ශක භාවිත කරනු ලබන්නේ ඒවා කුටුම්භ ජීවන වියදම ආවරණය කරනු ලබන නිසාය. ඒ අනුව, ශ්‍රී ලංකාවේ පාරිභෝගික මිල උද්ධමනය මැනීම සඳහා ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කර ප්‍රකාශයට පත් කරන ජාතික පාරිභෝගික මිල දර්ශකය සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය භාවිත කරනු ලබයි.

3.9 සිය උද්ධමන මිනුම ලෙස ශ්‍රී ලංකාව විසින් මතුපිට උද්ධමනය භාවිත කරනු ලැබේ. මතුපිට උද්ධමනය භාවිතය මගින් ජීවන වියදමේ වෙනස්වීම් ඉතා හොඳින් හඳුනා ගැනීමට හැකියාව ලැබෙන අතර, එය මහජනතාවට වඩා පහසුවෙන් වටහා ගැනීමට හැකි ලෙස සැකසී ඇත. මීට අමතර ව මූලික උද්ධමනය ද සලකා බැලෙන අතර, එතුළින් උද්ධමනයේ ඉල්ලුම මත පදනම් වූ සංරචකයන් මැනවින් දක්වා ඇත. එහෙත්, උද්ධමන අපේක්ෂා විශ්ලේෂණයන්ට අනුකූල ව, මතුපිට උද්ධමනය, මූලික උද්ධමනයට වඩා ශක්තිමත් සන්නිවේදන උපාංගයක් ලෙස හඳුනාගෙන ඇත. මෙයට ප්‍රධාන හේතුවක් ලෙස සලකා ඇත්තේ, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ අවශ්‍ය කෙරෙන ඉදිරි දැක්මකින් යුතු ප්‍රතිපත්ති සම්පාදනයේ දී මතුපිට උද්ධමනය මගින් උද්ධමන අපේක්ෂා මත ඇති කරනු ලබන බලපෑමයි.

3.10 උද්ධමනය මැනීම සඳහා භාවිතා කරනු ලබන ඉහත දර්ශකවලට අමතර ව උද්ධමනය සඳහා ප්‍රශස්ත ඉලක්කගත මට්ටම තීරණය කිරීම ද ඉතා වැදගත් වේ. මෙහි දී, ලක්ෂ්‍යයක් ඉලක්කගත කිරීම (point target), උද්ධමනය විචල්‍ය වීම සඳහා නිශ්චිත පරාසයක් සහිත උද්ධමන ඉලක්කයක් තීරණය කිරීම (point target with tolerance band) හෝ උද්ධමන පරාසයක් ඉලක්කගත කිරීම (target range) සිදු කරනු ලබයි. නිවැරදි තනි ඉලක්කයක් වෙත ළඟාවීම සෑම විට ම අපහසු බැවින් අනෙකුත් බොහෝ රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද උද්ධමනය විචල්‍ය වීම සඳහා නිශ්චිත පරාසයක් සහිත උද්ධමන ඉලක්කයක් ප්‍රකාශයට පත් කර ඇති අතර, එමගින් අදහස් වන්නේ ඉලක්කගත මට්ටමින් සැබෑ උද්ධමනය තාවකාලික ව බැහැරවීමේ යම් ඉඩකඩක් ඇති

බවයි. මැදි කාලීන උද්ධමන ඉලක්කය සහ සුදුසු කාල පරාසයක් සැකසීම සහ, ඒ පිළිබඳ තීරණ ගැනීම ඇතැම්විට රටක මුදල් අධිකාරිය විසින් ද, රජය විසින් ද හෝ එම රටෙහි මුදල් අධිකාරිය සහ රජය ඒකාබද්ධ ව ද සිදු කරනු ලබයි. විවිධ උද්ධමන ඉලක්කකරණ ආර්ථිකයන්හි වර්තමාන තත්ත්වයන් සහ විශ්ලේෂණයන්ගෙන් පෙන්නුම් කරන ආකාරයට උද්ධමන ඉලක්කමට අනුගතවීම සඳහා රටක රජයක් විසින් දරන ලබන උත්සහායට සමගාමී ව මැදි කාලීන උද්ධමන ඉලක්ක තීරණය කිරීම සඳහා එම රටෙහි මූල්‍ය අධිකාරිය සතු තාක්ෂණික දැනුම ද උපයෝගී වීම හේතුවෙන්, ශ්‍රී ලංකාව වැනි නැගී එන වෙළෙඳ පොළ ආර්ථිකයන් සහිත රටවල්, රජය සහ මහ බැංකුව ඒකාබද්ධව උද්ධමන ඉලක්කය තීරණය කිරීම සිදු කරයි.

3.11 ඒ අනුව, 2023 සැප්තැම්බර් මස සිට ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය අතර ඇති කර ගන්නා ලද ඒකාබද්ධ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අදාළ එකඟතාව ය ප්‍රකාර ව මැදිකාලීන උද්ධමනය 5% ක මට්ටමක පවත්වාගෙන යෑමට ශ්‍රී ලංකා මහ බැංකුවට නෛතිකමය වගකීමක් සහ වගවීමක් පැවරී ඇත[10].

## 04. නම්‍යශීලී උද්ධමන ඉලක්කරණ රාමුව සහ නීතිමය පදනම

4.1 1949 අංක 58 දරන මුදල් නීති (සංශෝධිත) පනත ප්‍රකාර ව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු අතර, ආර්ථික සහ මිල ස්ථායිතාව පවත්වාගෙන යෑමේ වගකීම, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී තිබිනි. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය ක්‍රියාත්මක කිරීමට සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ වන මිල ස්ථායිතාව ලඟා කර ගැනීම සැලසීම සඳහා මුදල් නීති පනත සංශෝධන කිරීමේ අවශ්‍යතාව 2017 වසර ආරම්භයේ සිටම පැන නැගී තිබුණි.

10 Government of Sri Lanka, “Monetary Policy Framework Agreement between the Minister of Finance and the Central Bank of Sri Lanka”, Gazette Extraordinary No. 2352/20 dated 05.10.2023, Government Printers.

4.2 මෙහිදී සංශෝධනය කළ යුතු යැයි අදහස් කළ මූලික නෛතික ප්‍රතිපාදන අතර මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී තිබූ අර්ධ රාජ්‍ය මූල්‍ය කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ක්‍රමයෙන් ඉවත් කිරීම සහ රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් සිදු කරන ලද ප්‍රතිමූල්‍යනය ක්‍රමයෙන් ඉවත් කිරීම ප්‍රධාන කරුනු ලෙස සැලකිය හැකිය. මේ සියල්ල අතර, මුදල් නීති පනතින් ස්ථාපිත නෛතික රාමුව තුළ පැවති ප්‍රතිපාදනයන් මගින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම මෙන් ම ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික, මූල්‍යමය සහ ක්‍රියාත්මක වීමේ ස්වාධීනත්වය පිළිබඳ ගැටලු මතු වී තිබුණි. මෙම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා ප්‍රායෝගික වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව රාජ්‍ය මූල්‍ය යාන්ත්‍රණය සමඟ සුහද ව කටයුතු කළ ද මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂම ව සහ ඵළදායි අයුරින් ක්‍රියාත්මක කිරීමට බාධා ඇතිවූ අවස්ථා ද තිබිනි. ඒ අනුව, මුදල් නීති පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මිල ස්ථායිතාවය පවත්වාගෙන යෑම සඳහා වූ නෛතික වගකීම නිසි අයුරින් ඉටු කිරීමට නොහැකි වීම වලක්වමින් මුදල් ප්‍රතිපත්තිය ස්වාධීන ලෙස ක්‍රියාත්මක කිරීමට සුදුසු නීතිමය රාමුවක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව ද පැන නැගිනි.

4.3 ඒ අනුව, පෙර සඳහන් පරිදි 2023 අංක 16 දරන නව ශ්‍රී ලංකා මහ බැංකු පනත ස්ථාපනය වූ අතර, එමගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලිකම අරමුණ වශයෙන්, ශ්‍රී ලංකාව තුළ මිළ ස්ථායිතාවය අත්කර ගැනීම සහ පවත්වාගෙන යෑම හඳුනාගෙන ඇති අතර, මහ බැංකුව වෙත නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නෛතික ප්‍රතිපාදන සලසා ඇත. තව ද, මෙම නව පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මූල්‍යමය, ආයතනික සහ මෙහෙයුම් ස්වාධීනත්වය ලබා දී ඇති අතර, නව පනත ප්‍රකාර ව සිය වගකීම් සහ බලතල

# උද්ධමන ඉලක්කය පිළිබඳ නව ශ්‍රී ලංකා මහ බැංකු පනතේ ප්‍රතිපාදන කෙටියෙන්[11]

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ළඟා කර ගත යුතු උද්ධමන ඉලක්කය දැක්වෙන මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමක් මුදල් ඇමතිවරයා සහ මහ බැංකුව විසින් අත්සන් කළ යුතුය. එසේ එකඟතාවට පැමිණිය නොහැකි අවස්ථාවන්හි දී අමාත්‍යවරයාගේ සහ මහ බැංකුවේ උද්ධමන ඉලක්ක අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමෙන් අනතුරු ව අමාත්‍ය මණ්ඩලය විසින් උද්ධමන ඉලක්කය තීරණය කරනු ලබයි. එම උද්ධමන ඉලක්කය සහ වෙනත් පරාමිතීන් ද ඇතුළුව මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම, එම ගිවිසුමට එළඹි දින සිට සතියක කාලයක් තුළ ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.
- උද්ධමන ඉලක්කය සහ ඊට අදාළ වෙනත් පරාමිතීන් සෑම වසර තුනකට ම වරක් හෝ සුවිශේෂී අවස්ථානුගත තත්ත්වයන් මත වෙනත් යම් කාල පරාස අනුව අමාත්‍යවරයා සහ මහ බැංකුව විසින් සමාලෝචනය කරනු ලැබිය හැකි අතර, එම සමාලෝචනයෙන් පසු අදාළ ඉලක්කය, පරාමිතීන් සහ පාදක වූ සුවිශේෂී අවස්ථානුගත තත්ත්වයන් ද ගැසට් පත්‍රයේ පළ කරනු ලැබේ.
- මෙසේ නිශ්චය කරනු ලබන උද්ධමන ඉලක්කය සපුරාලීමට මහ බැංකුව අනුක්‍රමික කාර්තු දෙකක දී අපොහොසත් වුවහොත්, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින්, ඒ සඳහා බලපෑ හේතු, යෝජිත ප්‍රතිකර්ම සහ කාලසීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් දැක්වෙන වාර්තාවක් මුදල් ඇමතිවරයා මගින් පාර්ලිමේන්තුව වෙත ලබා දිය යුතු වන අතර, එම වාර්තාව මහජන භාවිතය සඳහා ද විවෘත වේ.
- මුදල් ප්‍රතිපත්තිය, එය ක්‍රියාත්මක කිරීමට අදාළ වෙනත් උපකරණ මෙන් ම ඒවා අවශ්‍ය පරිදි සකසා ගැනීමට අධිකාරී බලය ද මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සතු වේ.
- සෑම මාස හයකට වරක් ම, උද්ධමනයේ මෑත කාලීන සංකලනයන්, ප්‍රභවයන් හා උද්ධමනය පිළිබඳ මධ්‍යකාලීන ප්‍රක්ෂේපන සහ ඒ කෙරෙහි වන ප්‍රධාන අවදානම් පිළිබඳ විස්තර වාර්තාවක් මහ බැංකුව විසින් පළ කළ යුතු ය.
- දේශීය මිල ස්ථායිතාවට තර්ජනයක් විය හැකි ආර්ථික බාධාවන් සිදුවෙතැයි මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය අපේක්ෂා කරන අවස්ථාවක දී හෝ ඒ සඳහා සත්‍ය වශයෙන් ම අන්තරායකාරී වන මිල මට්ටමේ අසාමාන්‍ය සංචලනයන් පවතින අවස්ථාවන්හි දී, එම තත්ත්වය සඳහා ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම මෙන් ම, ඒ සම්බන්ධව විශ්ලේෂණයක් ඇතුළත් විස්තරාත්මක වාර්තාවක් මුදල් අමාත්‍යවරයා වෙත මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ලබා දිය යුතු ය. තවද, මෙම වාර්තාව මහජනතාවගේ යහපතට අගතියක් නොවන්නේනම්, එය ප්‍රසිද්ධ කිරීමට ද මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයට වගකීමක් ඇත. එහි සඳහන් අවස්ථානුගත කරුණු දේශීය මිල ස්ථායිතාවයට තර්ජනයක්ව පවතිනතාක් කල් තවදුරටත් මෙම වාර්තාව ඉදිරිපත් කළ යුතු අතර, මුදල් ඇමතිවරයා විසින් එවැනි සිදුවීම් සලකා බැලීම සහ වැළැක්වීම සඳහා උචිත තීරණ ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත ද ඉදිරිපත් කළ යුතු ය.

11 26 සිට 28 වගන්ති, ශ්‍රී ලංකා මහ බැංකු පනත

ක්‍රියාත්මක කිරීමේ දී ඉතා ම විනිවිදභාවයකින් යුතු ව සහ වගවීමකින් යුතු ව කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධ නීතිමය රාමුව ඉතා පැහැදිලි ව දක්වා ඇත.

4.4 වඩාත් විශේෂිත කරුණු ලෙස තවදුරටත් නව ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් හඳුනාගෙන ඇත්තේ 4.2 ඡේදයේ දක්වා ඇති මුදල් නීති පනතේ පහසුකම් වලක්වාලන අයුරින් දක්වා ඇති නෛතික ප්‍රතිපාදනයයි. එනම්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේ දී මුදල් ප්‍රතිපත්තිය ස්වාධීන ලෙස ක්‍රියාත්මක කිරීමට සිදුවන බලපෑම් ක්‍රමයෙන් ඉවත් කිරීම වේ.

## 05. සමාප්තිය

වසර කිහිපයක අධ්‍යනයන්ගේ සහ භාවිතයේ ප්‍රතිඵලයක් වූ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව අනුගමනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අවශ්‍ය වූ නෛතික පිළිගැනීම නව ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ලබා දී ඇත. ඒ අනුව, මුදල් ප්‍රතිපත්ති රාමුව වශයෙන් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව ක්‍රියාත්මක කිරීම මගින් දේශීය වශයෙන් මිල ස්ථායිතාව පවත්වාගෙන යාමේ වගකීම සහ ඒ සඳහා වන වගකීමේ නෛතික ප්‍රතිපාදන මේ අනුව නව ශ්‍රී ලංකා මහ බැංකුව පනතින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ඇත.

## මූලාශ්‍ර


Agénor, Pierre-Richard, "Monetary Policy under Flexible Exchange Rates: An Introduction to Inflation Targeting", World Bank, 2000.

Anand, R., Ding, D., Shanaka J. Peiris., "Towards Inflation Targeting in Sri Lanka", IMF Working Paper WP/11/81, International Monetary Fund, 2011.

Ball, L. and Sheridan, N., "Does Inflation Targeting Matter?", NBER Working Paper Series: 9577, National Bureau of Economic Research, Federal Reserve Bank of New York, USA, 2003.

Bernanke, B. S., Laubach, T., Mishkin, F. S., and Posen, A. S., "Inflation Targeting: Lessons from the International Experience", Princeton University Press, 2001.

Bhalla, S. S., Bhasin, K., Loungani P., "Macro Effects of Formal Adoption of Inflation Targeting", IMF Working Paper WP/23/7, International Monetary Fund, 2023.

Central Bank of Sri Lanka, "Annual Report", 2015.

Central Bank of Sri Lanka, "Annual Report", 2018.

Government of Sri Lanka, "Monetary Law Act, No. 58 of 1949", Government Printers.

Government of Sri Lanka, "Central Bank of Sri Lanka, No. 16 of 2023", Government Printers.

Government of Sri Lanka, "Monetary Policy Framework Agreement between the Minister of Finance and the Central Bank of Sri Lanka", Gazette Extraordinary No. 2352/20 dated 05.10.2023, Government Printers.

International Monetary Fund, "Does Inflation Targeting Work in emerging Markets?" in World Economic Outlook, September 2005.

Musthafa, M. T., Le T., Suardi S., "Monetary Policy Transmission in Sri Lanka", Applied Economics, 56:2, 151-168, DOI, January 2023.

Perera, R. A. A., "Is Sri Lanka Ready for Inflation Targeting?", Central Banking and Financial Markets, Central Bank of Sri Lanka Inaugural International Research Conference, 2010.

Schaechter, Andrea, Stone, Mark R and Zelmer, Mark, "Adopting Inflation Targeting: Practical Issues for Emerging Market Countries", International Monetary Fund, 2000.